# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ නිකිණි පුර අටවක පෝදා 2022 අගෝස්තු 05 සිකුරාදා BUDUSARANA FRIDAY AUGUST 05, 2022

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 08 පත්‍රය , පිටු 10 ආරම්භය 1965 - 06 - 13




තක්ක ජාතක කතාවේ එන අවස්ථාවකි



# සසර දුක් වේදනා ගෙන දෙන කර්ම රැස් කරන්නේ කුමට ද?

**දිනක් මහ මුගලන් තෙරුන් හා ලක්ඛණ තෙරුන් රජගහ නුවර ගිජ්ඣකූට පව්ව සමීපයෙන් දිවා කල පිණ්ඩපාතයෙහි වැඩම කරන විට ප්‍රේතයෙක් දුටුහ. කිසි දිනක නොදුටු මෙම ප්‍රේතයාගේ ස්වරූපය වූයේ සර්පයකුගේ ශරීරයට සමාන වීමය. ගව් සියයක් පමණ දිග මිනිස් හිසක් සහිත වූ මෙම 'අහි' ප්‍රේතයා බිය උපදවන සුළු ස්වරූපයක් දැරුවේ ය.**

***නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.***

***"නහි පාපං කතං කම්මං***
***සජ්ජු ඛීරං ව මුච්චති***
***ඩහන්තං බල මන්වෙති***
***භස්මච්ඡන්නෝව පාවකෝ"***

කාරුණික පින්වතුනි,

**සියලු ලෝ සතුන් අමා දහමින් සනසා වදාළ අප අමාමෑණී ලොව්තුරා බුදුරජාණන් වහන්සේ විසින් වදාළ වටිනා දහම් කරුණු කිහිපයක් පින්වත් ඔබ වෙනුවෙන් අද දින ධර්ම දේශනාව මඟින් පහදා දීම සඳහායි බලාපොරොත්තු වන්නේ.**

" ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරි" යන උතුම් අවවාදයට අනුව ධර්මයෙහි හැසිරෙන්නා ධර්මය විසින්ම රකිනා බව දැක්වේ. ඒ අනුව අද දින ධර්ම දේශනාව සඳහා තෝරා ගත් ගාථා රත්නය බෞද්ධයාගේ අත් පොත වන ධම්ම පදයෙහි පාප වග්ගයට අයත් 12 වැන්නයි. එහි සරල අදහස මෙසේ ය.

"දෙනකගෙන් දොවන ලද කිරි එකෙනෙහි ම නොමිදෙන්නාක් මෙන් අනුවණයා විසින් කරන ලද පව් ද එම අවස්ථාවේ දී ම විපාක නොදෙයි. සසර පුරා ඔහු පසු පස ගමන් කරමින් විපාක දෙයි." යනුවෙනි.

දිනක් මහ මුගලන් තෙරුන් හා ලක්ඛණ තෙරුන් රජගහ නුවර ගිජ්ඣකූට පව්ව සමීපයෙන් දිවා කල පිණ්ඩපාතයෙහි වැඩම කරන විට ප්‍රේතයෙක් දුටුහ. කිසි දිනක නොදුටු මෙම ප්‍රේතයාගේ ස්වරූපය වූයේ සර්පයකුගේ ශරීරයට සමානය. ගව් සියයක් පමණ දිග මිනිස් හිසක් සහිත වූ මෙම 'අහි' ප්‍රේතයා බිය උපදවන සුළු ස්වරූපයක් දැරුවේ ය. ශරීරය පුරා ගිනිගෙන දැවෙන හෙතෙම අධික ලෙස වේදනා විඳිනු දුටු මහ රහතන් වහන්සේ දෙනම ඒ දෙස විමසිලිමත්ව බලා සිටිමින් පසුව පිණ්ඩපාතයෙහි වැඩම කළහ.

සවස් කාලයෙහි බුදුරදුන් හමුවීමට වැඩම කළ මුගලන් මහ තෙරුන් දිවා කල දුටු අහි ප්‍රේතයාගේ බියකරු ස්වරූපය විස්තර කර සිටියේ ය. පසුව උන්වහන්සේ බුදු හිමියන්ගෙන් විමසා සිටින්නේ මෙවැනි අයුරින් දුක් වේදනා විඳීමට සත්ත්වයාට සිදුවී ඇත්තේ කිනම් කර්ම විපාකයක් නිසා දැයි යනුවෙනි. එයට තථාගතයන් වහන්සේ අතීත සිදුවීම සිහිපත් කරමින් කර්මය පිළිබඳ මනාව පැහැදිලි කොට වදාළහ.

පෙර බරණැස ගඟබඩ අසල පසේ බුදුරජාණන් වහන්සේ නමක් වැඩ සිටි අතර උන්වහන්සේ හමුවට බොහෝ පිරිසක් දිනපතා දන්දීම, ධර්මය ඇසීම ආදිය සඳහා පැමිණෙති. මෙලෙස ආරාමයට ගමන් කරන්නේ ඒ අසල වූ කුඹුර මැදින් ඇති කුඩා අඩි පාර දිගේ ය. මෙය දුටු කුඹුරෙහි අයිතිකරු දිනෙන් දින මෙලෙස යන එන බොහෝ පිරිස නිසා වී කරල් පෑගී විනාශ වන බව දැන බොහෝ සෙයින් කෝපයට පත් වූයේ ය. ආරාමයෙහි වැඩ වසන ශ්‍රමණයන් එම ස්ථානයෙන් පළවා හැරීම මිස වෙනත් විකල්පයක් නොවන බව කල්පනා කළ මෙම පව්කාර ගොවියා දිනක් උදෑසනම කුඹුරට ගියේ ය.

පසේ බුදුරදුන් පිණ්ඩපාතයෙහි වැඩම කර ඇති බව දැනගත් හෙතෙම ආරාමයට ගොස් එහි තිබූ බොහෝ දෑ විනාශ කොට ආරාමයට ගිනි තැබුවේ ය. ආරාමය ගිනි ගන්නා අයුරු අසල පඳුරකට මුවා වී බලා සිටි මොහු අතිශයින් සතුටට පත්ව හොර රහසේ ම තම මිතුරකුගේ නිවසට ගොස් දින කිහිපයක් ගත කිරීමට සිතුවේ ය.

එහෙත් දිනක් දෙකක් ගත වන විට තමා සිදු කළ පාප ක්‍රියාව සිහිවන විට බෙහෙවින් පසුතැවීමට පත් වූ හෙතෙම ආහාර පවා ගැනීමට නොහැකිව බරපතළ ලෙස රෝගීව මිය ගියේ ය. එලෙස මිය ගොස් සතර අපාගත වී බොහෝ කටුක වේදනා විඳ එම කර්මයෙහි නිමාවක් නොමැති හෙයින් අහි ප්‍රේතයෙක් ව අද වන විට දුක් වේදනා අනුභව කරන අයුරු තථාගත බුදුරදුන් මුගලන් තෙරුන්ට මැනවින් කරුණු කාරණා පැහැදිලි කොට ඉහත ගාථාව වදාළ සේක. දෙනකගෙන් දොවන ලද කිරි එකෙනෙහි ම නොමිදෙන්නා සේ කර්මයෙහි විපාක හා නරක ස්වරූපය කෙබඳු ද යන්න මෙම කතා පුවත තුළින් මනාව පැහැදිලි වනු ඇත.

"කම්ම" යන පාලි වචනයෙන් කියැවෙන්නේ කර්මය යන්න යි. එනම් ක්‍රියාවයි. මෙයද යහපත් හා අයහපත් යන කොටස් දෙකකින් යුක්ත ය.

යහපත් ක්‍රියා තුළින් ලැබෙන්නේ සැප ය. එහෙත් අයහපත් ක්‍රියා තුළින් ලැබෙනුයේ බොහෝ කටුක දුක් වේදනාවන් ය. සසර සැරිසරන බොහෝ සත්ත්වයන් විසින් සිදුකරන ලද කර්ම ශක්තිය අනුව එහි ප්‍රතිඵල ද විඳින අයුරු අපට සමාජය තුළින් ද දැන ගත හැකි ය. "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි. චේතයිත්වා කම්මං වදාමි. කායේන වාචාය මනසා"

යන බුද්ධ වචනයෙන් පැහැදිලි වන්නේ පුද්ගලයාගේ තිදොර මුල් වීම තුළින් මෙකී කර්ම රැස් වන බවයි.

මේ නිසා සසර දුක් වේදනා විඳීමට ඉවහල් වන කර්ම රැස් නොකොට යහපත් කර්ම රැස් කොට මෙම සසර දුකින් එතෙර වීමට අදිටන් කර ගැනීම අතිශයින් වැදගත් ය. ඒ සඳහා ඔබ සැමට දහම් ඇස පහළ වේවා'යි පතන්නෙමු.

---

ගාල්ල ශ්‍රී ලංකා ධර්මදූත මහ පිරිවෙනේ
ආචාර්ය, දර්ශනපති
**කනංකේ විජිත නන්ද හිමි**



# උතුම් ධාතූන් වහන්සේ සැදැහැ සිතින් නමදිමු

**ධාතූන් වහන්සේලා ශාරීරික ධාතු, පාරිභෝගික ධාතු හා උද්දේසික ධාතු යනුවෙන් ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදිය හැකි ය. මින් ශාරීරික ධාතූන් වහන්සේ යනු ලොව්තුරා බුදුරදුන්ගේ කෙස්, දත්, අස්ථි, නිය ආදී ශරීර කොටස් ය. බුදුරදුන් පරිභෝග කළ පාත්‍ර, සිවුරු, ජල සාටක, පීඨාදිය පාරිභෝගික ධාතූහු වෙති.**

සමන්තකූට පර්වත මස්තකයේ පිහිටා ඇති ශ්‍රී පාද පද්මය ද පාරිභෝගික ධාතුවකි. මීට අමතරව බුදුරදුන් අධිෂ්ඨාන බලයෙන් පිහිට වූ තවත් ශ්‍රී පාද තුනක් පිළිබඳව, පුරාවෘත්ත හා ඓතිහාසික තොරතුරුවල සඳහන් වේ. ඒවා නර්මදා නදී තීරයේත්, සච්චබද්ධ පර්වතයේත් සුනාපරන්ත ජනපදයේ (අරාබියේ) මකුලකාරාම මහා විහාරයේත් (වර්තමානයේ මක්කම) පිහිටා ඇත.

ලොව්තුරා බුදුරදුන්ට උතුම් වූ බුද්ධත්වය සාක්ෂාත් කර ගැනීමට පිහිටාධාර වූ විජය ශ්‍රී බෝධි රාජයා ද, ලක්දිව මහමෙව්නාවේ රෝපණය කොට ඇති එහි දක්ෂිණ ශාඛාව ද, ඉන්දියාවේ සැවැත්නුවර දෙව්රමෙහි රෝපණය කොට ඇති ආනන්ද බෝධිය ද පාරිභෝගික ධාතු කොටසට ම අයත් වේ. බුදුරජාණන් වහන්සේ උදෙසා සකස් කොට ඇති ප්‍රතිමාදිය උද්දේසික ධාතු කොටසට අයත් වේ.

ලෝකයේ බොහෝ රටවල සර්වඥ ධාතූන් වහන්සේ විසිරී පැවතුණ ද ඉන් බොහෝ ධාතූන් වහන්සේ ප්‍රමාණයක් වැඩ සිටින්නේ අප ශ්‍රී ලංකා ධරණී තලයේ වීම ශ්‍රී ලාංකික බෞද්ධයන්ගේ අමන්දානන්දයට හේතු විය යුතු ය. එමතු නොව සාරිපුත්ත, මෞද්ගල්‍යායන, මහාකාශ්‍යප ආදී මහරහතන් වහන්සේලා කිහිප නමකගේ ශාරීරික ධාතූහු ද ලංකාවේ වැඩ සිටිති.

ධාතු යන පදය දැරීම් අර්ථයේ යෙදෙන අතර මෙහි කුමක් දරා ද යත්? පූජනීයත්වය, විචිත්‍රත්වය, ශ්‍රේෂ්ඨ තත්ත්වය දැරීම ධාතු නම් වේ. තිලොවට ම එකම අසහාය නායක වූ ලොව්තුරා බුදුරදුන්ගේ උතුම් වූ ශ්‍රී ශාරීරික ධාතු වන්දනා මාන කිරීම ලෝක සත්ත්වයාට මෙලොව පරලොව අභිවෘද්ධිය සලසා ගත හැකි යනු ඒකාන්ත සත්‍යයකි. එහි කිසිදු සැකයක් තබා නොගත යුතු ය.

මහාවංශ වැනි ලක්දිව ඓතිහාසික මූලාශ්‍රය පරීක්ෂා කිරීමේ දී පෙනී යනුයේ දුරාතීතයේ පටන් ලක්දිව වැඩ සිටි භික්ෂූන් වහන්සේ, රාජ රාජමහාමාත්‍යාදීන් මෙන් ම සාමාන්‍ය ජනතාව ද ධාතු වන්දනාව කෙරෙහි ඉමහත් සැලකිල්ලක් දක්වා ඇති බවයි. මහාවංශයේ සඳහන් වන අන්දමට වරක් මිහිඳු මහ රහතන් වහන්සේ දේවානම්පියතිස්ස රජුට පවසා ඇත්තේ හුඟ දවසකින් බුදුරදුන් නොදුටු බවයි.

ඒ අවස්ථාවේ දී විස්මයට පත් මහරජු ‘බුදුරදුන් පිරිනිවි ඇති හෙයින් කෙසේ නම් දකිම් ද’? යනුවෙන් විමසා ඇත. එවිට මිහිඳු හිමියන් පවසා ඇත්තේ “ධාතූන් වහන්සේ දුටු කල්හි බුදුරජාණන් වහන්සේ දුටුවා නම් වේ” යනුවෙනි. දීර්ඝායුෂ ඇති බුදුවරුන්ගේ ශ්‍රී දේහය ආදාහනය කළ කල්හි ධාතු නොවිසිරී රන් කඳක් මෙන් ඒකඝනව පවතී.

ඊට හේතුව එවැනි බුද්ධ ශාසනයක දී බොහෝ පිරිසකට ඉතා සුව සේ නිර්වාණාධිගමය කිරීමට හැකි වීමයි. මෙතෙක් ලොව පහළ වූ පස්විසි බුදුවරුන් අතරින් සොළොස් නමකගේ ම ශ්‍රී දේහයට එසේ සිදු වී ඇත. මෙම මහා භද්‍ර කල්පයේ සිව්වැනිව ලොව පහළ වූ අප තථාගත ගෞතම බුදුරදුන් අල්ප ආයු ඇති හෙයින් පිරිනිවන් පෑමට පෙර “මාගේ ශාසනය තවමත් සෑම තැනක ම පැතිරී නැත. බොහෝ සත්ත්වයන් තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑ පසු ශාරීරික ධාතූන් ගෙන ස්තූප කරවා වන්දනාමාන කොට මරණින් පසු සුගතිගාමී වන්නේ ය”යි සිතා ධාතු විසිරීමට අදිටන් කළ සේක.

ඒ අනුව ලලාට ධාතුව, අකු ධාතු දෙක, සතර දළදාවන් යන මෙම ධාතු සත හැර ඉතිරි සියලු අස්ථි ධාතූන් වහන්සේ කුඩා කුඩා කොටස්වලට බෙදී වෙන් වී ගියහ. ඒවා ප්‍රමාණයෙන් අබ ඇටයක් තරම් වන අතර දීප්තියෙන් මුතුවන් පැහයෙන් යුක්ත වේ.

තථාගත ශ්‍රී දේහය ආදාහනයෙන් පසු ධාතූන් වහන්සේ ලබා ගැනීමට කුසිනාරා නුවර මල්ල රජදරුවෝ, විශාලා මහනුවර ලිච්ඡවී රජදරුවෝ, කිඹුල්වත්පුර ශාක්‍යයෝ, අල්ලකප්පරට බුලයෝ, රාම ග්‍රාමයේ කෝලියෝ, වේඨදීප නගරාධිපති බ්‍රාහ්මණයා හා පාවා නුවරවැසි මල්ල රජදරුවෝ ඉදිරිපත් වූ අතර පසුව මෙය කෝලාහලයක් බවට පත්විය.

ඉන්පසු එම කෝලාහලය සන්සිඳුවා ද්‍රෝණ බමුණා සියලු දෙනාට ම සම සේ ධාතු බෙදා දීමට ඉදිරිපත් විය.

ඔහු විසින් ධාතු බෙදා දෙන ලදුව ඒවා ලබා ගත් ඒ සියල්ලෝ ම තම තමන්ගේ නගරවලට ගෙන ගොස් ධාතූන් වහන්සේ තැන්පත් කොට ස්තූප ඉදි කොට වන්දනාමාන කළහ.

පසුව මහාකාශ්‍යප මහරහතන් වහන්සේට ධ්‍යානයට සමවැදී මත්තෙහි ශාසනයට සිදුවන සතුරු ආක්‍රමණ දැක ඒ හේතුවෙන් ධාතූන් වහන්සේ වන විනාශය දැක ඒ ඒ තැන්වල ඉදි කොට තිබූ ස්තූපවල ධාතු කොටසක් පමණක් ඉතිරි කොට අනෙක් සියලුම ධාතු ඍද්ධි බලයෙන් ලබාගෙන ඒවා සුරක්ෂිතව තැන්පත් කොට ආරක්ෂාව ද සපයා තැබූහ.

පසුව ධර්මාශෝක මහාධිරාජයා ධාතූන් වහන්සේ නැවතත් ලබාගෙන දඹදිව කර වූ අසූහාරදහසක් වෙහෙර විහාරයන්හි ධාතූන් වහන්සේ තැන්පත් කළ අතර, වරින් වර ලක්දිවට ද ඉන් බොහෝ ධාතූන් වහන්සේ ප්‍රමාණයක් වැඩම කරවූහ. මුළු ලක්දිවටම සිළුමිණක් බඳු වූ රුවන්වැලි මහා සෑයේ ද්‍රෝණයක් පමණ සර්වඥ ධාතූන් වහන්සේ තැන්පත් කොට ඇති බව ථූපවංසය, මහාවංසය වැනි මූලාශ්‍රයන්හි පැහැදිලිව ම දක්වා ඇත.

නොවිසිරුණු ධාතු අතරින් ලලාට ධාතූන් වහන්සේ ප්‍රමාණයෙන් විශාල ම ධාතූන් වහන්සේයි. ධාතූන් වහන්සේ බෙදීමේ දී ලලාට ධාතුව මල්ල රජ දරුවන්ගේ ධාතු කොටසට අයත් වූ අතර මහාවංශයේ දැක්වෙන අන්දමට පසුව බුදුරදුන් ජීවමාන සමයෙහි ම “මාගේ ලලාට ධාතුව ශ්‍රී ලංකාද්වීපයෙහි පිහිටුවන්නැ”යි කර තිබූ අනුදැනීමට අනුව මහකසුප් මහරහත් හිමියෝ එය මල්ල රජ දරුවන්ගෙන් ලබා ගෙන එය සද්ධිවිහාරික නන්ද හිමියන්ට භාර කොට ඇත.

ඉන්පසු මෙය දඹදිව ආරක්ෂිතව තිබී පසුව මහානාග රජු දවස මහාදේව මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම කර වූහ. ලක්දිව රජදරුවන් විසින් මැනවින් ආරක්ෂා කරන ලදුව පසුව කාවන්තිස්ස රජු දවස බුදුරදුන්ගේ ශ්‍රී ශරීරයේ ප්‍රමාණයට සත් රුවනින් බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් කරවා එහි නළල් තලයේ ලලාට ධාතුව තැන්පත් කොට එම බුද්ධ ප්‍රතිමාව නිදන් කොට සේරුවිල මංගල මහා සෑයේ තැන්පත් කොට ඇත.

දකුණු අකු ධාතූන් වහන්සේ මුලින් තව්තිසා දෙව්ලොව වැඩ සිටි අතර පසුව මිහිඳු මහරහතන් වහන්සේගේ උපදෙස් පරිදි සුමන සාමණේරයන් වහන්සේ ඍද්ධියෙන් තව්තිසා දිව්‍ය ලෝකයට වැඩම කොට ශක්‍රදේවේන්ද්‍රයාගෙන් එය ලබාගෙන දේවානම්පියතිස්ස රජුට භාර කළ අතර පසුව එය තැන්පත් කොට අනුරාධපුරයේ සෑයක් කළ අතර එය ථූපාරාම මහා සෑය ලෙස හැඳින්වේ.

මිහින්දාගමනයෙන් පසුව ලක්දිව ඉදි වූ පළමු සෑය ද මෙය වේ. වම් අකු ධාතූන් වහන්සේ බ්‍රහ්ම ලෝකයේ වැඩ සිටින බව බුද්ධවංස පාළියේ සඳහන් වන අතර ඊට වැඩි තොරතුරක් එහි ඇතුළත් නොවේ. සතර දළදා අතරින් දකුණු යටි දළදාවහන්සේ පොළොන්නරුවේ සෝමවතී සෑයේ ද, වම් යටි දළදාවහන්සේ ශ්‍රී සෙංකඩගලපුර උතුම් වූ දළදා මන්දිරයේ ද තැන්පත් කොට ඇත.

තවත් දළදාවක් තව්තිසා දිව්‍ය ලෝකයේ සිළුමිණිසෑයේ තැන්පත් කොට ඇති අතර, අනෙක් දළදාවහන්සේ ධාතු බෙදා දීමේ උත්සවයට ගන්ධාරයෙන් (පකිස්ථානය) පැමිණි මහානුභාව සම්පන්න පුද්ගලයකුගේ අතට පත්ව ගන්ධාරයට ගෙන ගොස් ඇති අතර වර්තමානයේ එය කොහේ ඇත්දැයි වැඩිදුර තොරතුරක් මූලාශ්‍රවල සඳහන් නොවේ.

නොවිසිරුණු මේ සප්ත ධාතූන් වහන්සේට අමතරව බුදුරදුන්ගේ අනෙක් තිස් හයක් වූ දළදාවන් ද, කේස ධාතූන් වහන්සේ ද ඌර්ණ රෝම ධාතූන් වහන්සේ ඇතුළු රෝම ධාතූන් වහන්සේ ද තථාගත ශ්‍රී දේහයට ගිනි දැල්වීමට පෙර මහානුභාව සම්පන්න දෙවියන් විසින් ගත් බව සඳහන් වේ. ඒ පිළිබඳ සවිස්තර තොරතුරු මෙම ග්‍රන්ථයේ ඇතුළත් වේ.

අප ගෞතම බුදුරදුන්ගේ මේ බුද්ධ ශාසනය විනාශ වීමට මත්තෙන් නොයෙක් රටවල විසිරී ඇති සියලු ධාතූන් වහන්සේ ඒකරාශී වී දඹදිව වජ්‍රාසනය අසල දී නිර්මිත බුදුරුවක් නිර්මාණය වී සියලු ධාතූහු අතුදහන් වෙති. එය ‘ධාතුපරිනිර්වාණය’ ලෙස හැඳින්වේ.

---

පාමංකඩ ශ්‍රී මහා විහාරාධිකාරී, මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනේ ආචාර්ය, රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති
**වල්පොළ සිරි පියරතන හිමි**

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## නිකිණි පුර අටවක 2022-08-05

## වචනයක බලය

වචනය අපූර්ව මෙවලමකි. ලෝකයක් සනසන්නට සේ ම වනසන්නට ද වචනයට පුළුවන. මුදු වචනය සිත් පහදන්නේ ය. රළු වචනය සිත් රිදවන්නේ ය. දැවෙන තැවෙන සිතකට මුදු වදන අපමණ සිසිලක් සුවයක් ගෙන දෙයි. යහපත් වූ ත්, සත්‍ය වූ ත් මුදු වචන කතා කරන කෙනෙක් වේ නම් ඔහු තමන්ට සේ ම සමාජයට ද අර්ථකාරී පුද්ගලයෙකි.

එහෙත් ඔවුනොවුන් අතර ගැටුම් ඇතිකරන, සමාජය උඩුයටිකුරු කරන වචනය මහා විනාශයක මූලාරම්භය ද විය හැකි ය. වචනය පුදුම සහගත මෙවලමක් වන්නේ එහෙයිනි.

වචනය අර්ථවත් ලෙස භාවිතයේ යෙදවීමේ අගය අන් කවරදාටත් වඩා මෙකල දැඩිව දැනේ. ඒ පවුල් පරිසරයෙන් ආරම්භ වී ගමක, රටක,ලෝකයක සාමකාමී බවට, සහජීවනයට, දියුණුවට, ප්‍රශ්න නිරාකරණයට වචනය මහත් බලපෑමක් සිදු කරන බැවිනි.

සම්බුදු දහමේ අසත්‍ය වචනය සපුරා ප්‍රතික්ෂේප කරයි. බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ බොරු කිව හැකි පුද්ගලයාට කළ නොහැකි වරදක් නැති බවයි. මුවින් පිටවන වචනයේ බරපතළකම නිසාම උන්වහන්සේ වචන භාවිතය අනුව මේ ලෝකයෙහි පුද්ගලයින් තිදෙනෙක් විද්‍යාමාන වන බව පෙන්වා දුන්හ. ඒ ගූථභාණී, පුප්ඵභාණී, මධුභාණී යනුවෙනි.

ගූථභාණී පුද්ගලයා යනු අශූචි බඳු වචන ඇත්තා ය. ස්වල්ප වුව ද අශූචි දුර්ගන්ධ ය. කිසිවෙක් ප්‍රිය නොකරන්නේ ය. දුරින් දුරු කරන්නේ ය. එහෙත් අපේ ඇතැම් වචන ද අසූචි හා සම ය. එහෙත් බොහෝ දෙනෙක් ඒ දුර්ගන්ධවත් වදන් බැහැර කරනවා වෙනුවට නිරන්තරයෙන් භාවිත කරමින් වටපිටාව ද දුර්ගන්ධවත් කරන්නේ ය. එවැනි ගූථභාණීහු කවරහුද?

යම් පුද්ගලයෙක් සභාවක් මැදට පමුණුවයි. පිරිසක් අතරට, ඥාති සමූහයා මැදට ගෙන්වයි. එසේ ගෙන්වා යම්කිසි දෙයක් පිළිබඳ කියා ඔබ දන්නා දෙය කියන්නැයි ඇසින් දුටු දේ ගැන විමසයි. එවිට ඒ පුද්ගලයා නොදන්නා දෙය 'දනිමි' යැයි කියයි. දන්නා දෙය 'නොදනිමි' කියයි. නොදුටු දෙය දුටුවෙමි'යි කියයි. දුටු දෙය නොදුටුවෙමි' යි කියයි.

මෙසේ ඔහු දැන දැනම බොරු කියන්නේ යම් පරමාර්ථයකිනි. ඒ තමන්ගේ ආරක්ෂාවට විය හැකි ය. එක්කෝ අනුන් ආරක්ෂා කිරීමට විය හැකි ය. එසේත් නැතිනම් තමන්ට ලාභයක් වෙනුවෙන් විය හැකි ය. මෙවැනි පිරිස් අප අතර කොතෙක් නම් වේ ද? ඇඳුමෙන් පැළඳුමෙන්, ගමන් විලාසයෙන උසස් යැයි පෙන්වීමට උත්සාහ ගත්තද වචනයෙන් ඔවුහු ගූථභාණීහු ය. තමන් දුර්ගන්ධවත් වී සමාජයද දුගඳ පතුරුවන්නෙන් ය. එවැනි බොරුවක් නිසා තමන් සැනසෙනවා විය හැකි ය. එහෙත් තවත් කෙනකුගේ ජීවිතයට මහා අනතුරක් ඒ තුළ ගැබ්වී තිබෙන්නට පුළුවන. ඍජු ප්‍රතිපත්ති ඇති පුද්ගලයකු කිසි කලෙකත් එවැනි තැනකට නොවැටෙන්නේ ය. ඒ, කවර ලාභයක්, පිළිගැනීමක් හමුවේ වුව තම ප්‍රතිපත්ති පාවා නොදෙන බැවිනි. සැබෑ බෞද්ධයා ද එවැන්නෙකි. ඔහු තුළ බොරුවට ඉඩ නැත. රැවටීමට ඉඩ නැත. ඔහු තමන්ගේ ආරක්ෂාව වනුවෙන්වත්, අනුන්ගේ ආරක්ෂාව වෙනුවෙන්වත්, ලාභාපේක්ෂාවෙන්වත් බොරු නොකියන්නේ ය.

තමන් ගැන නිවැරැදි තක්සේරුවකට පැමිණිය යුතු ය. තමන් දුටු නොදුටු දේ ගැන මෙවැනි බොහෝ අවස්ථාවන්ට මුහුණ දෙන්නට අපට ද සිදුවනු ඇත. යම් හෙයකින් බොරුවක් පැවසුවේ නම්, ඒ මොහොතේ සිට ම යමකින් බේරුණා යැයි, යමක් ලැබුණා යැයි සැබෑ ලෙසම සතුටු විය නොහැකි ය. එක් අතෙකින් එය පාප කර්මයකි. කළ කම්වලට විපාක ගෙවන්නට ම සිදුවනු ඇත. එහෙයින් වචනය නම් වූ අවිය නිවැරැදිව හැසිරවිය යුතු ම ය. එය තමන්ගේ ද, සමාජයේ ද යහපත පිණිස ම ය. සදහම් මඟ යන්නා දුර්ගන්ධවත් පුද්ගලයෙක් නොව සුගන්ධවත් පුද්ගලයෙක් ම ය.

# බලවත් අකුසල කර්ම විපාකයක් දුබල කරන්නට පුළුවන්ද?

**කර්ම යනු ක්‍රියාවයි. කර්ම යනු පව් පින් දෙකටම සාධාරණ නමකි. 'කුක්කුරවත' නමින් මජ්ඣිම නිකායේ එන එක් සූත්‍රයක් ඇත. එහි පුණ්ණ හා සේනිය නම් වූ මිතුරන් දෙදෙනෙක් වෙති. දිගු කාලයක සිට ඔවුහු ගෝව්‍රත හා සුනඛ ව්‍රත රකින නිගණ්ඨනාථ ශ්‍රාවක දෙපළකි. දිනක් මේ මිතුරන් දෙදෙනා බුදුරජාණන් වහන්සේ හමුවීමට ගියහ.**

උන්වහන්සේට තමන් හඳුන්වා දී, ඔවුන්ගේ මතු භවය කෙසේ වන්නේ දැයි විමසූහ. බුදුරජාණන් වහන්සේ ඊට පිළිතුරු දීම තෙවරක් ම ප්‍රතික්ෂේප කළහ. එහෙත් එය කියන ලෙස ඔවුහු නැවත නැවත ඉල්ලා සිටියහ. එවිට බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනාකොට වදාළහ.

"පුණ්ණ, යම් පුද්ගලයෙක් මෙලොව සුනඛවත්, සුනඛසිල්, සුනඛසිත්, සුනඛ වෙස් අඩු නොකොට, නිරතුරුව වඩන්නේ ද? හේ මරණින් මතු සුනඛයන්ගේ ම සභාවයට පැමිණෙයි. යම් කෙනෙක් මෙම ව්‍රත ශීලයක්, ව්‍රතයක්, තපසක් බඹසරක් වශයෙන් ඉතා දිගු කලක් රැක ගත් හෙයින් තමන්ගේ මරණින් මතු දෙවියන් හෝ බ්‍රාහ්මණයන් හෝ අතර සහවාසයට යන්නේ යැයි සිතයි නම් පුණ්ණ එය මිථ්‍යා දෘෂ්ඨියකි.

පුණ්ණ මම මිථ්‍යාදෘෂ්ඨිකයාහට මරණින් මතු ගති දෙකක් කියමි. එනම්, නරකය හෝ තිරිසන් යෝනියයි. මේ දෙගතින් අතුරෙන් එක්තරා ගතියක් හිමි වේ.

මෙසේ වැරැදි දෘෂ්ඨි ගෙන රකින සුනඛවත ඇත්තේ සුනඛයන්ගේ ස්වභාවයටම යයි. ගවයකු මෙන් හැසිරීමේ වත (ගෝව්‍රත) ගත්තෝ ද එසේ ම ය. බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කොට වදාළ කල දෙදෙනාම හැඬූහ.

මේ ගෝව්‍රතය, කුක්කුරව්‍රතය අපි බොහෝ කල් සිට රකිමු. මම (පුණ්ණ) භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුනෙමි. මමත්, සේනියත් මේ ව්‍රත හැර දමන්නෙමු. අපට ගැළපෙන දහමක් දෙසන්නට භාග්‍යවතුන් වහන්සේ සමත්හයි කීහ. ඒ අවස්ථාව මුල් කොට මේ කර්ම දේශනාව තථාගතයන් වහන්සේ මේ අයුරින් දේශනා කොට වදාළහ.

පුණ්ණ, මා විසින් මගේම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ ලෙස දැනගෙන ඇති සතර කර්ම කෙනෙක් වෙති.

එනම්, අකුසල් වූ අකුසල් විපාක ඇති කර්මයක් ඇත. මෙලොව යම් පුද්ගලයෙක් දුක් සහිත වූ කයෙන් කෙරෙන අකුසල් රැස් කරයි ද? දුක් සහිත වූ වචනයෙන් කෙරෙන අකුසල් රැස් කරයි ද? දුක් සහිත වූ සිතෙන් කරන අකුසල් රැස් කරයි ද? ඔහු දුක් සහිත ලෝකයට එළඹෙයි. එහි ඇත්තා වූ දුක් සහිත ස්පර්ශ ලබමින් දුක් වේදනා විඳියි. අකුසල් කරන්නෝ නිරයේ ම උපදිති. මේ නිසා සත්වයා කර්මය දායාද කොට ඇතැයි කියමි.

කුසල් වූ, කුසල් විපාක ඇති කර්මයක් ඇත. මෙලොව යම් පුද්ගලයෙක් නිදුක් වූ කාය සංස්කාර රැස් කරයි. නිදුක් වූ වචී සංස්කාර රැස් කරයි. නිදුක් වූ මනක්සංස්කාර රැස්කරයි. එහෙයින් ම ඔහු නිදුක් ලොවට එළඹෙයි. මෙසේ හෙයින් සත්ත්වයා කර්ම දායාද කොට ඇතැයි කියමි.

කුසල් අකුසල් වූ කුසල් අකුසල් විපාක ඇති කර්මයක් ඇත. මෙලොව කෙනෙක් දුක් සහිත වූ අකුසල් ද, සැප සහිත වූ කුසල් ද මිශ්‍රව කයින් ද, වචනයෙන් ද, මනසින් ද සිදු කරයි. ඔහු දුක් සහිතවූත්, සැප සහිත වූත් මිශ්‍ර විපාක දෙන ලෝකයට එළඹෙයි. එහි වූ ඒ ඒ ස්පර්ශයෝ සහිත වේදනා විඳී. ඒ මිනිසුන් සෙයින් ය. එසේම ඇතැම් දෙවියන් සෙයින් ය. ඇතැම් විනිපාතිකයින් සෙයින් ය. සමහර මිනිසුන් එකම ජීවිතය තුළ, දුක් විඳී. සැප ද ලබයි. දෙවියන් අතර පිනෙන් උපත ලද මුත් භූමාටු දෙවියන් සේ දුක් ද විඳී. විනිපාතකයන් අතර පේතවස්තු කතාවල දක්නට ලැබෙන ලෙස ප්‍රේත ලොව උපත ලද මුත් කලින් කළ පුණ්‍ය විපාක ලෙස විමාන ප්‍රේතයන් ව සැප ද ලබයි. කරන ලද පව් අනුව තිරිසන් ලොව උපත ලැබුව ද මංගල හස්තියකු සේ, මංගල අසකු සේ, අජානීය ගවයකු සේ සැප ද ලබයි.



අකුසල් ද නොවූ, කුසල් ද නොවූ අකුසල් කුසල් නොවූ විපාක ද ඇති කර්මය ක්ෂය කිරීම පිණිස පවතින කර්මයක් ඇත. පළමු කී ත්‍රිවිධ කර්ම දුරු කිරීම පිණිස යම් චේතනාවක් වේ ද, ඒ කර්මය කර්මක්ෂය පිණිස පවතියි.

යම් කෙනෙක් රහත් ඵලය පිණිස දස සංයෝජන නසන්නේ ක්‍රියා සිත් පමණක් ඇත්තේ ද, ඔහු කර්මක්ෂය පුද්ගලයා වන්නේ ය. පළමු කී ත්‍රිවිධ කර්ම දුරු කිරීම පිණිස යම් චේතනාවක් වේ ද ඒ කර්මය, කර්මක්ෂය පිණිස පවතියි යැයි වදාළ සේක.

මෙසේ වූ සතර කර්මයෝ දායාද කොට ප්‍රතිසන්ධි ස්ථානය වන්නේ විපාක වශයෙනි. මෙහිදී විපාක දෙන්නේ කර්මයයි. මෙසේ ප්‍රතිසන්ධිය ලබා දෙන කර්ම පිළිබඳ විනිශ්චය මෙසේ ය. කර්ම කෘත්‍ය වශයෙන් සතර වැදෑරුම් ය.

### ජනක කර්මය

අනාගත ප්‍රතිසන්ධිය ගෙන දීමට ප්‍රබල වූ, බලවත් වූ කර්මය මෙ නම් වේ. දුර්වල කර්ම වේ නම්, බලවත් ජනක කර්මයකින් ලැබූ ප්‍රතිසන්ධිය තුළ වරින්වර විපාක වශයෙන් සැප දුක් ලබා දෙයි. මෙය චුති චිත්තය හා බැඳේ. කර්මය, කර්ම නිමිත්ත හා ගති නිමිත්ත වශයෙනි.

### උපස්ථම්භක කර්මය

උපන් සත්වයාට පව් පින් වශයෙන් විඳීමට හේතුවන කර්ම මෙ නම් වේ. ජීවිත කාලය පුරා පමණක් නොව අකුසල වශයෙන් ගත්විට තව තවත් දුක් විඳීම සඳහා ජීවත් කරවීම ද, නැවත නැවත යහපත (කුසල්) කරවීමට ජිවත් කරවීම ද මෙසේ වේ. එසේ වන්නේ තමා කරන යහපත් ක්‍රියාවෙන් ඇතිවන සතුට හා ප්‍රීතිය මත ය. කර්මයක් කර්මයකට අනුබල දෙන ආකාරය මෙ නම් වේ. ලැබූ ජීවිතය තුළ විශේෂ සැප හෝ දුක් විශේෂ කොට ලැබෙන්නේ මෙයින් ය.

### උප පීඩක කර්මය

ඉපදුණ සත්වයාට බලවත් පීඩා කරන්නේ මෙ නම් කර්මයයි. උපත ධනවත් පවුලක වුවත් අංගවිකල බව, හදිසියේ මතුවන බලවත් රෝග, තනතුරු පහකිරීම, ධන හානිය, ගින්නෙන්, ගං වතුරෙන්, රජුන්ගෙන්, සොරුන්ගෙන්, සතුරන්ගෙන් වන හානි මෙසේ ය. ඒ තාක් අකුසල විපාක විඳින්නේ බලවත් සේ කුසල් කරන්නේ නම් ඒ කුසල් බලයෙන් බලවත් අකුසලය දුබල වේ. උදා - ලෙඩරෝග සඳහා බෝධි පූජා, දන්දීම්, ධර්මයට නැඹුරුවීම් ආදිය සැලකිය හැකි ය.

### උපඝාතක කර්මය

උපච්ඡේදක කර්මය ද මෙය ම ය. චුති චිත්තයට මතුව ආ ජනක කර්මයකින් ප්‍රතිසන්ධි වශයෙන් යම් උප්පත්තියක් ලැබූවත්, ඒ ජනක කර්ම ශක්තිය බිඳලන කර්මය මෙ නම් වේ. උපන් ආත්මයක ආයුෂ විඳීමට අවකාශ නොදී උපඝාතක කර්මයෙන් ඔහු එයින් චුත කරන්නේ ය. අකාල මරණ යැයි අපි කියන්නේ මෙවැනි අවස්ථාවකයි.

**කේ.කේ. සුගතපාල**

# සමාජයක දියුණුව

# සමගිය තිබෙනතුරු පමණයි

**නීතිගරුකත්වය හා සාමය අන්‍යොන්‍ය වශයෙන් ඒකාබද්ධ වූ වචන දෙකකි. නීතිගරුක සමාජය දියුණුවෙන් දියුණුවට යන බවත්, නීතිගරුකත්වයෙන් තොර සමාජය පරිහානියට පත්වන බවත් දී.නි. මහා පරිනිබ්බාන සූත්‍රයේ සප්ත අපරිහානී ධර්ම යටතේ දක්වා ඇත.**

ප්‍රාථමික සමාජයන් තුළ නීතිරීති පිළිබඳ එතරම් සැලකිල්ලක් දක්වා නොමැති බව ප්‍රකටව පෙනේ. එයට හේතුව එම සමාජ තත්වයන්හි සාමූහික ක්‍රියාකාරකම් හා ගැටුම් නොමැති වීම හා අවම වීමයි. නීතිරීති අවශ්‍ය වන්නේ සමූහයක් ලෙස සාමූහිකව කටයුතු කිරීමේ දී

සැපදායක ලෙස ජීවිත ගතකිරීම පිණිසයි. නීතිරීතිවල අපේක්ෂාව වන්නේ ද සාමූහික ජීවිතයේ පහසු පැවැත්ම ඇති කිරීම බව දේශනාවේ ද දැක්වේ.

බුදු සමය තුළ ආරම්භයේ දී ම විනය ශික්ෂා (විනය ප්‍රඥප්ති) පනවා නොතිබුණි. විනය ශික්ෂා පනවන්නේ ආසවට්ඨානීය ධර්ම පහළ වීමෙන් පසුව බව ද පෙළ සාහිත්‍යයේ දැක්වේ.

එම ආසවට්ඨානීය ධර්ම නම්, රත්තඤ්ඤු මහන්තතා - බොහෝ කල්ගත වීම, වේපුල්ල මහන්තතා - පිරිස බහුල වීම, බාහුසච්ච මහන්තතා - බහුශ්‍රැතයන් වැඩිවීම, ලාභග්ග මහන්තතා - ලාභ සත්කාර වැඩි වීම, මෙම කරුණු මුල් කරගෙන විනය නීති පැනවීම ශාසනයේ චිර පැවැත්මට හේතු වූ බව කිව යුතු ය.

නීතිගරුකතාවයේ අවශ්‍යතාව ශික්ෂා පද පැනවීමේ පරමාර්ථ විමසීමෙන් ද පැහැදිලි කර ගත හැකි ය. විනය පනවා ඇත්තේ සංඝ සමාජයේ කටයුතු කරන්නන්ට පහසුව පිණිසත්, (සංඝ ඵාසුතාය) සංඝයාගේ යහපත පිණිසත් (සංඝ සුට්ඨුතාය) සලකාගෙන ය.

එබැවින් භික්ෂූන් වහන්සේ, විනය නීති තම යහපත වෙනුවෙන් පනවා ඇති කරුණු ලෙස සලකා ගෞරවයෙන් ඒවා ආරක්ෂා කරන්නට පුරුදු වූහ. සාමාන්‍ය ජන සමාජයේ ද නීතිරීති ක්‍රියාත්මක වේ. එම නීති රීති පනවා ඇත්තේ සාමාජික කටයුතු නිරවුල් කිරීමටත්, පහසු කිරීමටත් ය. එබැවින් සමාජගත පුද්ගලයා නීතිගරුක වීම එම සමාජයේ යහපතට හේතු වේ.

එබැවින් බෞද්ධ උපදේශය වන්නේ පුද්ගලයා නීතිගරුකත්වයෙන් ක්‍රියාකළ යුතු බවයි.

හිංසනයට විරුද්ධ වූ බුදු සමය පවා විනය නීති උල්ලංඝනය කරන්නන්ට දඬුවම් ලබාදීම ප්‍රතික්ෂේප නොකරයි. එසේ ලබා දෙන දඬුවම් අතර බ්‍රහ්ම දණ්ඩනය - සමාජයෙන් ඉවත්කොට තැබීම, මානත් පිරීම - තත්වයෙන් පහතට දැමීම, පරිවාස - ආයති සංවරය පිණිස කල් ලබාදීම හා ආවරණ කර්ම - සාමණේරයෝ ඇසුරෙන් ඉවත් කිරීම යනාදිය ප්‍රමුඛ වේ.

මෙසේ දඬුවම් ලබා දුන්න ද මේ කිසිවක් අමානුෂීය දඬුවම් නොවේ.

මෙම දඬුවම් පවා හිමි වන්නේ සමූහයාගේ පැවැත්මට බාධා වන අයුරින් නීතිරීති බිඳින්නන්ට පමණි.

කෙසේ වෙතත් බුදු සමය දඬුවම, නීතිගරුත්වය ඇති කිරීමේ එකම සාධකය ලෙස නොසලකයි. බෞද්ධ ආකල්පය වන්නේ නැවත වැරැදි කිරීමෙන් වළක්වා ආයති සංවරය ඇති කරවීමට ක්‍රියා කිරීමයි.

නීතිය යනු සමාජ සම්මතයකි. සමාජ සම්මතයන් ඉක්මවා නොයෑම සදාචාර සම්පන්න සමාජයේ ප්‍රබල යුතුකමක් හා වගකීමකි. සමාජ සම්මතයන් බිඳින පිරිස ඉන් වැළැක්වීමට නම් වැරැදි කරන පිරිසට නිග්‍රහ කිරීමත්, නීතිගරුක අයට ප්‍රශංසා කිරීමත් අවශ්‍ය වේ.

මිනිස් සමාජය ප්‍රශංසා ලැබීමට කැමති වන අතර නිග්‍රහ ලැබීමට අකැමැති ය. එවිට නීතිගරුත්වයට යොමු වී ප්‍රශංසනීය පුද්ගලයකු බවට පත් වීමට සමාජය නිරන්තරව යොමු වේ.

බුදු දහම සමාජ විරෝධී ක්‍රියාවන් නැති කිරීමට ඒකායන ක්‍රමවේදය ලෙස දඬුවම නොදක්වනවා සේ ම නීතිය ද එකම ක්‍රමය ලෙස නොදක්වයි. නීතිරීති ක්‍රියාත්මක කරන අතරම මිනිසා වරදට යොමු වීමේ හේතු නැති කිරීමට ද පාලන තන්ත්‍රය විසින් ක්‍රියා කළ යුතු වේ. ඒබ ව දී.නි. කූටදන්ත, චක්කවත්ති සීහනාද ආදී සූත්‍රවලින් ප්‍රකාශ වේ.

සමාජයක දියුණුව පවතින්නේ සමගිය හෙවත් සාමග්‍රිය පවතින තුරු ය. සමගිය ඇති වීමට නීති ගරුකත්වය සෘජු ලෙසම බලපායි. භික්ෂු සමාජය සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියාත්මක වන්නේ ඔවුන් තුළ ඇති නීතිගරුක ලක්ෂණ නිසා ය.

භික්ෂු ශාසනයේ ආයුෂ ලෙස සැලකෙන්නේ ද (විනයෝ නාම සාසනස්ස ආයු) විනය හෙවත් නිතිගරුකත්ව යයි. මේ ආදී කරුණු තුළින් නීතිගරුක වීම සමගියට හා සහජීවනයට අවශ්‍ය වන වැදගත්ම කාරණාවක් බව පැහැදිලි වේ.

ගා/හෙට්ටිඨාවල මහ පිරිවෙනේ
**පදලංගල අස්සජි හිමි**

## කවරයේ කතාව



බරණැස බඹදත් නම් රජ කෙනෙක් විය. එකල අප බෝසතාණන් වහන්සේ තවුස් දම් පුරා ධ්‍යාන සමාපත්ති උපදවා ගං තෙරක විසූහ. බරණැස් සිටුතුමාට නපුරු ගති ඇති දූ කුමරියක් විය. දිනක් දැසි දසුන් පිරිවර සමඟ ගඟට බැස දිය නාමින් සිටිය දී දිය පහරකට ගසාගෙන ගිය කුමරිය අප බෝසතාණන් වහන්සේ වැඩ සිටි පන්සල සමීපයට පැමිණ තිබුණි.

කෑ ගසන හඬක් ඇසී බෝසතාණෝ හුළු අත්තක එළියෙන් ගඟට ගොස් කුමරිය බේරා ගත්හ. පන්සලට රැගෙන විත් ගිනි ගොඩක් ගසා, ඇයගේ සීතල පහකොට පලතුරු ආහාරයට දී තතු විමසූහ. ඉන් අනතුරුව පන්සලේ එළිමහනෙහි නවාතැන් පහසුව සලසා දුන්හ. ඒ පසු දින පිටව යන ලෙස දැන්වීමෙන් අනතුරුව ය.

ඒ කුමරිය තාපසයන්ගේ සිල්බිඳ රැගෙන යම් යන සිතින් එහිම වාසය කරන්නීය. ස්ත්‍රී ලීලා, ස්ත්‍රී නිමිති දක්වමින් තාපසයන්ගේ සීලය බිඳ ධ්‍යාන සමාපත්තියෙන් පිරිහෙළා ටික දිනක් ආරණ්‍යයෙහි විසූහ. එසේ සිට මිනිස් වාසයට යමුයි පිටිසර ගමකට ගියහ. එහි දී මෝරු විකිණීමෙන් ජීවිකාව කළ ඔහුට තක්කපණ්ඩිත යන නාමය පටබැඳිණි.

ඉන් අනතුරුව ඒ ගම් වැසියෝ, අපට අනුශාසනා කරමින් මේ ගමෙහි ම වාසය කරන්නැයි ද පවසා කුටියක් ද තනා දුන්හ. දිනක් ගම පහරන සොරු, මේ ගම කොල්ල කා මේ ගැහැනිය ද පැහැරගෙන ගොස්

සොරදෙටුවාගේ භාර්යාව වශයෙන් රඳවා ගත්හ. සොරදෙටුවාගේ බිරිඳ වූ මම දැන් සුව සේ වාසය කරමි. තක්කපණ්ඩිත කවර උපායකින් හෝ පැමිණ නැවත මා රැගෙන ගියහොත් දුකට වැටෙයි. ඒ නිසා ඔහු මෙහි ගෙන්වා මරා දැමිය යුතු යැයි සිතීය.

එසේ කල්පනා කොට මෙවැනි උපක්‍රමයක් යෙදවීය. ඒ මෙතැන දුකින් ජීවත්වෙමි වහා පැමිණ මා ගෙන යන්න යැයි ලියා තක්කපණ්ඩිතයන්ට ලිපියක් යැවීය. එය බලා ඒ ගැහැනිය සොයා ගිය තක්කපණ්ඩිතයන්ට හමු වූ සොරදෙටුවාගේ බිරිඳ ස්වාමීනි, අප රෑ බෝ වී යෑම අනතුරුදායක ය. ඒ නිසා උදෑසනින් ම යමුයි, පවසා ඔහු ව නවතා ගත්තේ ය. සවස සොරදෙටුවා රා බී මත් වූ වේලාවේ ස්වාමීනි, ඔබගේ සතුරා හමු වූ විටක කුමක් කරන්නේ දැයි විමසීය. සොරදෙටුවා ඔහු කොහේ දැයි විමසූ විට මෙහි යැයි පැවසීය.

වහා එහි ගිය සොරදෙටුවා තක්කපණ්ඩිතයන් බිම පෙරළාගෙන අතින් පයින් තළා බැඳ දැමීය. ඒ වෙලාවේ දී පණ්ඩිතයෝ "කෝධනා අකතඤ්ඤු ච පිසුනා ච විභේදිකා" යන පද සතර නැවත නැවතත් කීය. සොරා මහ රෑ නැඟිට ගොස් නැවතත් තළන්නට විය. පණ්ඩිතයෝ එවිටත් ඒ පද සතර කීය. එවිට සොරදෙටුවා පින්වත මෙපමණ පීඩා ලබමින් කුමක් නිසා මේ සතර පදයම කියන්නේ දැයි ඇසීය.

පණ්ඩිතයෝ සියලු කතා පුවත හෙළි කොට ඒ ගැහැනිය මා මෙහි කැඳවා තොප අතට පත් කළ බව පැවසීය. ඒ ඇසූ සොරදෙටුවා, මෙබඳු ගුණ ඇති, උපකාර වූ සත්පුරුෂ යකුටත් මෙසේ කළ ගැහැනිය මට කුමක් නොකරයි ද? සිතූහ.

එසේ සිතා පණ්ඩිතයන් සනසා, ගැහැනිය අවදි කරවා ගමින් පිටතට ගොස් මොහු මරාදම'මුයි පවසා කඩුව ගෙන ගොස් පණ්ඩිතයන්ට ගසන බව අඟවා ගැහැනිය දෙකඩවන සේ කඩුවෙන් ගසා මරා දැමීය.

තක්කපණ්ඩිතයෝ ගිහි ගෙයින් පලක් නැතැයි නැවතත් තවුස් දම් පුරා දැහැන් වඩා බඹලොව උපන්හ.

එකල සොරදෙටු දැන් ආනන්ද හිමියන් ය. තක්කපණ්ඩිත නම් බුදුරජාණන් වහන්සේ යැයි වදාළ සේක.

***තක්ක ජාතක කතාව ඇසුරිනි***

කළුතර දකුණ අල්විස්වත්ත, ශ්‍රී නිකේතාරාම විහාරාධිපති පල්ලත්තර ජිනානන්ද නා හිමියන්, කළුතර දිස්ත්‍රික්කයේ සහ පස් යොදුන් කෝරළයේ ප්‍රධාන අධිකරණ සංඝ නායක පදවිය සමග "සද්ධර්ම කීර්ති ශ්‍රී ඉන්ද්‍රජෝති" යන ගෞරව නාමයෙන් පසු ගිය 15 වැනි දින, ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශවයේ අති ගරු මහා නායක, තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහා නායක ස්වාමීන් වහන්සේ වෙතින් පිදුම් ලැබු අතර, උන් වහන්සේ පිළිගෙන උපහාර පිදීමේ පුණ්‍ය මහෝත්සවය ජුලි 17වැනි ඉරිදා කළුතර ඓතිහාසික බෝධි භාරකාර මණ්ඩලයේ ධර්ම ශාලාවේ දී ගිහි පැවිදි විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.



# අධිකරණ සංඝනායක ධුරයෙන් පිදුම් ලබන

# පල්ලත්තර ජිනානන්ද නා හිමිපාණන් වහන්සේ

**දකුණු ලක හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි පල්ලත්තර නම් වූ සුන්දර ගම් පියසෙහි,පත්තිනිගෙවත්ත නම් නිවෙසෙහි දී,1950 සැප්තැම්බර් 06වැනි දින,පටබැඳි පතිරනගේ දියෝනිස් හා හේවා අත්ගමගේ ලැන්සිහාමි යන මව්පියන්ට දාව, පටබැඳි පතිරන යන නමින් ජන්ම ලාභය ලැබුවේ ය.**

සහෝදර සහෝදරියන් එකොළොස් දෙනකුගේ පවුලක පස්වැනියා වූ මේ පින්වත් කුමරුවා පල්ලත්තර මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා ,සසර පෙර කරන ලද කුසල කර්මයක ප්‍රතිඵලයක බල මහිමයෙන් කුඩා කල සිටම පැවිදි වීමට දැක්වූ ආශාව නිසා,ඕකේවෙල පුරාණ විහාරාධිපති පූජ්‍ය ගැටමාන්නේ ඉන්ද්‍රජෝති නා හිමියන්ගේ ආචාර්යත්වයෙන් 1966/09/02 වැනි දින පල්ලත්තර ජිනානන්ද නමින් සාමණේර හිමි නමක් බවට උතුම් වූ සසුන් ගත වූහ.

කුඩා සාමණේරයන් වහන්සේ නමක් වුව ද,විහාරස්ථානයේ දී උගත යුතු සියලු බණ දහම් සපුරා,මූලික අධ්‍යාපනය සඳහා බෙලිඅත්ත හාල්පන්දෙණිය ශ්‍රී විසුද්ධාරාම විහාරස්ථ ශ්‍රී සරණපාල පිරිවෙන හා කළුතර වාද්දුව මොල්ලිගොඩ ප්‍රවචනෝදය මහා පිරිවෙනෙන් ද ඉන්පසුව පැපිලියාන සුනේත්‍රාදේවි මහ පිරිවෙන වෙතින් ද ලබා ගෙන උසස් අධ්‍යාපනය සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුළත් විය.

එහිදී ගෞරව ශාස්ත්‍රවේදී උපාධියක් හිමි කර ගත් අප කථා නායක හිමියෝ රත්මලාන පරමධම්මචේතිය ගුරු අභ්‍යාස විද්‍යාලයේ ප්‍රවීණාචාර්ය උපාධිය ද මාලිගාකන්ද විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය ද ලබා ගත්හ.

උක්ත පිරිවෙන් අධ්‍යාපනය ද විශ්ව විද්‍යාලය මඟින් ද ප්‍රාමාණික අධ්‍යාපනයක් ලබා සිටි පල්ලත්තර ජිනානන්ද පොඩි හාමුදුරුවෝ,1971 ජුනි 31 වැනි දින,රාජ පූජිත මල්වතු මහා විහාරස්ථ උපෝසථ පුෂ්පාරාම මහා විහාරස්ථානයේ දී,අල්විස්වත්ත ශ්‍රී නිකේතාරාමාධිපතිව වැඩ විසූ පූජ්‍ය ගැටමාන්නේ ලොකු හාමුදුරුවන් වහන්සේගේ ආචාර්යත්වයෙන් උතුම් වූ අධිශීල සංඛ්‍යාත උපසම්පදා පැවිද්දට එළඹියහ.

1975දී කළුතර දකුණ අල්විස්වත්ත ශ්‍රී නිකේතාරාම විහාරස්ථානයට වැඩම කළ පල්ලත්තර ජිනානන්ද හිමියෝ තම ගුරු දේවෝත්තම ලොකු හාමුදුරුවන් වහන්සේගේ සියලු ඇප උපස්ථාන ඉටු කරමින්, වර්ෂ 1979 දී වස්කඩුව දෙදියවල ශ්‍රී ධර්මාරාම පිරිවෙන් ප්‍රවීණාචාර්ය වහන්සේ නමක් ලෙස,ගුරු සේවාව ආරම්භ කළහ.

2010 /09/06දින දක්වා එම පිරිවෙනෙහි ආචාර්ය වහන්සේ නමක් හැටියට තම රාජකාරි ඉටුකොට එහිම නියෝජ්‍ය පරිවෙණාධිපති වහන්සේ නමක් ලෙස ගුරු සේවයෙන් විශ්‍රාම දිවියට එලඹුණෝ ය.

ගුරු සේවයෙන් විශ්‍රාම ලැබූ අප නා හිමියෝ දකුණු කළුතර අල්විස්වත්ත ශ්‍රී නිකේතාරාමය අංග සම්පූර්ණ විහාරස්ථානයක් බවට පත්කිරීමට අප්‍රමාණ වෙහෙසක් ගෙන දිවා රෑ දෙකෙහිම දැඩි කැපවීමෙන් දායක කාරකාදින් සමඟ වැඩ කළහ.

තම විහාරස්ථානයට අඩුපාඩුවක්ව තිබූ චෛත්‍ය රාජයාණන් වහන්සේ,බෝධි ප්‍රාකාරය,ධර්ම ශාලාව හා ආවාස ගෙය වැනි අත්‍යවශ්‍ය අංගවලින් සමලංකෘත අංග සම්පූර්ණ විහාරස්ථානයක් බවට පත් කළේ උන් වහන්සේ තුළ තිබූ අප්‍රතිහත ධෛර්යය හා උත්සාහය නිසා ය.

දේශීය හා විදේශීය ධර්ම ප්‍රචාරක කටයුතු මෙහෙයවමින් නිරතුරුව ම උන් වහන්සේ මැලේසියාව,සිංගප්පූරුව,කාම්බෝජය, වියට්නාමය හා චීනය වැනි බෞද්ධ රටවල ධර්ම ප්‍රචාරක කටයුතුවල නිරත වූ අතර,දේශීය වශයෙන් ආගමික හා සංස්කෘතික කටයුතුවල දී නායකත්වය හා අනුශාසකත්වය ගෙන කටයුතු කළහ.

පසුගිය යුද සමයේ දී මායිම් ගම්මානවලට නිර්භීත ව වැඩම කොට ඒ පෙදෙස්වල ජීවත්වන ජනතාවගේ අවශ්‍යතා සඳහා වැඩම කොට ඔවුන්ගේ විවිධ වූ අඩුපාඩු සොයා බලා ජාතික සේවාවන් රාශියක් ඉටුකළ අප පින්වත් නාහිමියෝ අල්විස්වත්ත ශ්‍රී නිකේතාරාම විහාරස්ථානයේ දහම් පාසලක් ආරම්භ කොට ප්‍රදේශයේ දුවා දරුවන්ට දහම් පිපාසය සංසිඳුවා ගන්නට සුවිශේෂ දායකත්වයක් දැරූ, යුගයේ මහා යතිවරයන් වහන්සේ නමකි.

තවද සම්බුද්ධ ශාසනයට ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ පිරිසක් බිහි කළ උන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ වශයෙන් කළුතර අධිකාරිගොඩ විද්‍යාලයේ ධර්මාචාර්ය ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත තාරපේළියේ ගුණරතන ස්වාමීන් වහන්සේ හා තායිවානයේ උසස් අධ්‍යාපනය ලබන පූජ්‍ය පල්ලත්තර පියරතන හිමි ද පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපාධි ලැබූ සූරියවැව හේමරතන හිමියන් ද ඇතුළුව පැවිදි පිරිසක් සසුනට දායාද කොට ඇත.

සම්බුදු සසුනේ චිර පැවැත්මට මෙතරම් වූ සුවිශේෂ යුග මෙහෙවරක් ඉටු කළ අප පින්වත් පල්ලත්තර ජිනානන්ද ස්වාමීන් වහන්සේගෙන් ඉටු වූ අප්‍රමාණ ශාසනික, ජාතික හා සමාජයීය සේවයට උපහාර පුද කිරීමක් හා සේවය ඇගයීමක් වශයෙන් ස්‍යාමෝපාලී වංශික මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශවයේ අතිපූජ්‍ය මහා නායක ස්වාමීන්වහන්සේ ප්‍රධාන සානුනායක කාරක සංඝ සභාව මඟින් උන් වහන්සේ වෙත “කළුතර දිස්ත්‍රික්කයේ හා පස් යොදුන් කෝරළයේ ප්‍රධාන අධිකරණ සංඝ නායක පදවිය ,”,සද්ධර්ම කීර්ති ශ්‍රී ඉන්ද්‍රජෝති”යන ගෞරව නාමය සහිතවපිරිනමා ඇත

ඒ පිළිබඳ සන්නස්පත්‍ර පිළිගැන්වීමේ මහා උත්සවයක් පසු ගිය ජුනි 15 වැනි දා රාජ පූජිත උපෝසථ පුෂ්පාරාම විහාරස්ථානයේ දී සිදු කළ අතර, උන්වහන්සේ ගෞරව සම්ප්‍රයුක්තව පිළිගෙන උන්වහන්සේට උපහාර ආශීර්වාදාත්මක සෙත්පැතීම හා එම සන්නස් පත, විජිනිපත පිළිගැන්වීමේ උත්සවයක් පසු ගිය 17 වැනි ඉරිදා කළුතර බෝධිභාරකාර ධර්ම ශාලාවේ දී අතිපූජ්‍ය නියංගොඩ විජිතසිරි අනු නායක ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

සම්බුද්ධ සසුනේ තව තවත් වැඩ වඩන්නට අප පින්වත් නායක ස්වාමීන් වහන්සේට ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් හා ආශිර්වාදයෙන් යෝධ බල, යෝධ ශක්තිය ලැබේවායි ද ඒ සඳහා උන් වහන්සේට චිරාත් කාලයක් වැඩ වසන්නට තෙරුවන් බලයෙන් ශක්තිය වාසනාව ලැබේවා යි ද ප්‍රාර්ථනා කරමි.

**කළුතර මධ්‍යම විශේෂ**
**එච්.එල්.සුනිල් ශාන්ත**

# ලෝකයම දහම් සිසිලෙන් නිවා දැමීම භික්ෂූන් වහන්සේට පැවරෙන කාර්යභාරයක්



උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ

**ජර්මනියේ ශ්‍රී ලංකා මහා විහාරාධිපති ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේ ජර්මන් ආයතනයේ ආයතනාධිපති ජොහානස් ගුටන්බර්ග් සරසවියේ කථිකාචාර්ය කරුණා සමාධි සංවිධානයේ අධ්‍යක්ෂ ජර්මනියේ ප්‍රධාන අධිකරණ සංඝනායක සද්ධර්ම කීර්ති ශ්‍රී**

## රත්මලේ පුඤ්ඤරතනාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.

**බුදුදහමෙන් ලොවට හෙළිකළ ශාන්තිය මානව වර්ගයාගේ යහපත උදෙසා ලෝක ජනතාවට ගෙනයාමේ ප්‍රධාන භූමිකාව වන්නේ භික්ෂුවයි. මනා භික්ෂු චර්යාවෙන් සෝභමාන වියත් භික්ෂුවක් වශයෙන් සිදුකරන එකී මහානීය සේවාව පාඨකයා වෙත දැනුවත් කරමින් සාකච්ඡාව ආරම්භ කරමු අපේ හාමුදුරුවනේ,**

විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් අනතුරුව හිඟුරක්ගොඩ ජයමග පිරිවෙන,දොරණෑගොඩ සදානන්ද මහ පිරිවෙන යන පරිවේණාස්ථානවල පරිවේණාචාර්යවරයකු ලෙස සිදුකළ ධර්ම ශාස්ත්‍රීය සේවය ලෝකාර්ථ චර්යාව පිණිස පෑවුල කිරීමට අවස්ථාවක් උදාවුණා. 1996 වර්ෂයේ දී ශ්‍රී ලංකා ජර්මන් ධර්ම දූත සංගමයේ ආරාධනාවකට අනුව අතිපූජ්‍ය රඹුක්වැල්ලේ දේවානන්ද නායක හිමිපාණන් වහන්සේගේ මඟ පෙන්වීමෙන් ජර්මනියේ බර්ලින් විහාරයට වැඩම කළා.

එහිදී ඒකාකාරී කාර්යබහුල ජීවන රටාව නිසා විශාල මානසික පීඩනයට හසුවූ යුරෝපීය ජනයාගේ දහම් පිපාසයට දහම් ඔසුවක් වෙමින් ඔවුන්ට භාවනාව පුරුදු පුහුණු කළා වගේම බර්ලින්හි පාඨශාලා,ආරෝග්‍ය ශාලා හා බන්ධනාගාර සිරකරුවන් වෙනුවෙන් භාවනාවේ ආධ්‍යාත්මික සුවය ළඟා කර දුන්නා.


බර්ලින් ප්‍රාන්තයේ Frankfurt වැඩම කර බුද්ධ ප්‍රඥ විහාරයේ වැඩ වෙසෙමින් එම නගරය ආශ්‍රිතව වෙසෙන ශ්‍රී ලාංකික,තායි, වියට්නාම් වගේම ජර්මන් ජාතිකයන්ගේ දහම් පවස නිවමින් ආධ්‍යාත්මික සුවතාවය ළඟාකර දීමට කටයුතු කළා. 2014 වර්ෂයේ දී උතුරු ජර්මනියේ සියලු විහාරාරාංගයන්ගෙන් සමලංකෘත දර්ශනීය ශ්‍රී ලංකා මහා විහාරය ආරම්භ කරමින් හැම්බර්ග්,බ්‍රේටන්,හැනෝවා නගර ආශ්‍රිත බෞද්ධ සැදැහැවතුන්ගේ ආගමික අවශ්‍යතා ඉටුකරමින් ථේරවාදී භික්ෂුවක් වශයෙන් බුරුමය,වියට්නාමය,තායි වානය,ඉන්දියාව,මැලේසියාව,සිංගප්පූරුව රටවල් වගේම චෙකොස්ලෝවැකියාව, අයර්ලන්තය, මහා බ්‍රිතාන්‍ය වැනි රටවල ජාත්‍යන්තර සමුළු රාශියක් නියෝජනය කරමින් ථේරවාදී බෞද්ධ දර්ශනය ලෝකයා වෙත රැගෙන යාමට කටයුතු කළා. ලෝකාර්ථ චර්යාවෙහි නියැළී සිටින ධර්මදූතයන් වහන්සේ නමක් වශයෙන් ඔස්ට්‍රියාව,ප්‍රංශය,ස්විට්සර්ලන්තය ඉතාලිය ආදී රටවල වැඩම කරමින් එම ජනතාව වෙත බුදු දහමේ හරය තුළින් ලබන පණිවිඩය ලබා දීමට කටයුතු කරමින් වර්තමානය වන විට ජර්මනිය තුළ භාවනා උපදේශකවරයකු ලෙස කටයුතු කරනවා.

බුද්ධ ප්‍රඥ විහාරය, දකුණු ජර්මනියේ බුදුමග විහාරය,වගේම ශ්‍රී ලංකා මහා විහාරය කේන්ද්‍රකරගෙන එම භාවනා වැඩ සටහන් ක්‍රියාත්මක කරගෙන යනවා. 2005 වර්ෂයේ සිට ජර්මනියේ මයින්ස් නුවර ජොහානස් ගුටන්බර්ග් විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයකු වශයෙන් කටයුතු කරමින් ඒ හරහා ජර්මන් ජාතික සිසුන්ට බෞද්ධ දර්ශනය, සිංහල,පාලි භාෂා අවබෝධය ලබාදෙනවා. 2007 වර්ෂයේ දී ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේ ජර්මන් ආයතනය ආරම්භ කරමින් ආයතනාධිපති වශයෙන් විදේශීය භික්ෂූන් වහන්සේලාගේ වාර්ෂික පරීක්ෂණ සිදුකරමින් බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, අභිවෘද්ධිය වෙනුවෙන් ලෝකාර්ථ චර්යාවෙහි නියැළෙමින් නිර්මල බුදුදහම ලෝකය පුරා ව්‍යාප්ත කිරීමේ හැකියාව තිබෙන පරිපූර්ණ භික්ෂු පිරිසක් දායාද කළා. ඒවගේම සිත හදන බණ කතා, බුදුදහම සහ දර්ශනය ආදී ග්‍රන්ථ රචනා කරමින් බෞද්ධ ලෝකයට දායාද කළා. 2004 වර්ෂයේ දී කරුණා සමාධි සංවිධානය ආරම්භකරමින් විශාල සමාජ සේවා රාශියක් සිදුකරගෙන යනවා. ආර්ථික අපහසුතා ඇති දරුවන්ට ශිෂ්‍යාධාර,පෙර පාසල් අධ්‍යාපන සේවා, නිවාස ආධාර,වෛද්‍යාධාර සැපයීම, වෘත්තීය පුහුණු පාඨමාලා ලබා දෙමින් ස්වයං රැකියා සඳහා උපකාර කළා. උගත් බුද්ධිමත් භික්ෂු පරපුරක් වෙනුවෙන් සාමණේර කැපකරු දායක ක්‍රමයට හා පිරිවෙන් සංවර්ධනයට අවශ්‍ය ආධාර කරුණා සමාධි සංවිධානය හරහා සිදුකරගෙන යනවා.

**භාෂාන්තරඥණයෙන් පිරිපුන් ශික්ෂාකාමී බහුශ්‍රැත භික්ෂුන් වහන්සේ නමක් වශයෙන් මේසා විශාල කාර්යභාරයක් සිදුකරන්නට ගුරු හාමුදුරුවන්ගෙන් ලැබුණු ආභාසය සිහපත් කරන්න නායක හාමුදුරුවනේ,**

සැදැහැති මව්පියන්ගෙන් ලැබුණු ශාසනික උරුමයත් ,පූර්වෝපචිත පුණ්‍ය ශක්තියත් අනුව පූජනීය රත්මලේ ශ්‍රී ගුණරතන නාහිමි,පල්ලවදම්පිටියේ චන්ද්‍රජෝති නාහිමි,හා රත්මලේ සෝමරතන යන සුපේශල ශික්ෂාකාමී යතීන්ද්‍රයන් වහන්සේලාගේ ආචාර්ය උපාධ්‍යායත්වයෙන් 1979 මැයි මස 10 වැනි දින රත්මලේ පුඤ්ඤරතන යන උතුම් ශාසනික නාමයෙන් පැවිදි ජීවිතයට ඇතුළත් වුණා. අනතුරුව ධර්මවිනයධර ශ්‍රද්ධා සම්පන්න ආදර්ශවත් සංඝ නේතෘන් වහන්සේලාගේ අනුශාසනා වගේම පිරිවෙන් අධ්‍යාපනය තුළින් ලැබූ ශික්ෂණයත් පැවිදි ජීවිතය ඔපවත් කර ගනිමින් පූර්වෝපචිත කුසලශ්‍රීයෙන් විරාජමාන වෙමින් 1990 ජූනි මස 23 වැනි දින මල්වතු මහා විහාරීය මංගල උපෝෂථාගාරයෙ දී අධිශීල සංඛ්‍යාත උපසම්පදාවට පත්වීමට තරම් පින්වන්ත වුණා.

දොරණෑගොඩ සදානන්ද මහ පිරිවෙන්පතිව වැඩසිටි අපවත්වී වදාළ රඹුක්වැල්ලේ ශ්‍රී පඤ්ඤසාර නාහිමි, හිඟුරක්ගොඩ ජයමග මහ පිරිවෙන්පති අපවත්වී වදාළ කුඹුක්කඩවල ශ්‍රී ධිරානන්ද නාහිමි යන සාර්වභෞම පාණ්ඩිත්‍යයෙන් පිරිපුන් සංඝ සෝභන ගුණාංගයන්ගෙන් සම්භාවනාවට පාත්‍ර



වූ ආදර්ශවත් මහා යතිවරුන්ගේ ඇසුර පැවිදි ජීවිතයට පරමාදර්ශයක් වුණා.

වාරණ මංගලගිරි පිරිවෙන,දොරණෑගොඩ සදානන්ද මහ පිරිවෙන යන පරිවේණාස්ථානය තුළ ධර්ම ශාස්ත්‍රීය ශික්ෂණය ලබා මරදාන ශ්‍රී ලංකා විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය හදාරමින් 1984 වර්ෂයේ දී කැලණිය විශ්ව විද්‍යාලයට ඇතුළත්ව 1990 වර්ෂයේ දී ශාස්ත්‍රවේදී උපාධියත් 1993 වර්ෂයේ දී ශාස්ත්‍රපති උපාධියත් ලබාගෙන 1999 වර්ෂයේ දී ජර්මනියේ Goethe Institut ආයතනයෙන් ජර්මන් භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව ලබා ගත්තා. 2014 වර්ෂයේ දී අමෙරිකා එක්සත් ජනපදයේ කැලිපෝනියා ග්ලෝබල් සරසවියෙන් ආචාර්ය උපාධිය ලබා ගැනීමට කටයුතු කළා. ලංකා ශාසනම්බරය ආලෝකවත් කරමින් නිවැරැදි ශසනික ප්‍රතිපදාව අනුගමනය කළ සුපේශල ශික්ෂාකාමි අර්ථ චර්යාවෙන් සම්භාවනාවට පාත්‍රව වැඩ විසූ ගුරු දේවෝත්තමපාදයන් වහන්සේලාගේ සෙනෙහස,රැකවරණය, දූරදර්ශී මඟපෙන්වීම, වගේම උන්වහන්සේලාගෙන් ලැබුණු උත්තුංග ධෛර්ය නොලැබෙන්නට අද මේ තැන්වල නොසිටින්න පුළුවන්. උන්වහන්සේලාගේ ආශිර්වාදය පැවිදි ජීවිතය ප්‍රභාස්වරවීමට මූලික හේතුව වුණු බව පුණ්‍යානුමෝදනා පූර්වකව කෘතවේදීව ගෞරව බහුමානයෙන් යුතුව සිහිපත් කළ යුතුයි.

**බුදුදහමේ ආලෝකයෙන් ලෝකයා සැනසීමට අනාගත භික්ෂූන් වහන්සේ හැඩගැසිය යුතු ආකාරය පිළිබඳ ඔබ වහන්සේ දරන මතය කෙබඳුද?**

සමාජයට යම් සේවාවක් සිදුකිරීම භික්ෂුවගේ උරුමයක් වගේම යුතුකමක්. එකිනෙකාට යුද ප්‍රකාශ කරගෙන ගිනිගෙන දැවෙන සමස්ත ලෝකයම කටයුතු කරන කාලයක දහම් සිසිල ජන මනසට ලබාදීමේ කාර්යභාරය බෞද්ධ භික්ෂූන් වහන්සේට පැවරී තිබෙනවා. භාග්‍යවතුන් වහන්සේ තරම් මානව දයාව යථාර්ථවත්ව ගැඹුරින් සාකච්ඡා කළ ආදර්ශයෙන් ක්‍රියා කළ ශාස්තෘන් වහන්සේ නමක් ලෝක ඉතිහාසයේ හමුවන්නේ නැහැ. මෛත්‍රී, කරුණාවේ දහම් පණිවිඩය ජනතාව වෙත ලබා දීමේ වගකීම බෞද්ධ භික්ෂූන් වහන්සේට තිබෙන නිසා එම වගකීම හා යුතුකම මොකක්ද කියන එක භික්ෂූන් වහන්සේලා වඩාත් ගැඹුරින් තේරුම් ගත යුතුයි. මෛත්‍රී,කරුණාව, ප්‍රඥව පදනම වූ බුද්ධ ශාසනයේ ශ්‍රමණයන් වහන්සේ දැකීමත් මහා මංගල කාරණයක් නිසා බුද්ධ චීවරය පොරවාගෙන දමනය වූ ඉඳුරන්ගෙන්, සන්සුන් ගමනින් වැඩම කරන භික්ෂූන් වහන්සේ නමක් යුරෝපය තුළ පයින් වැඩම කිරීමත් ධර්මදූත සේවයක්.

භික්ෂූන් වහන්සේගේ සන්සුන් ඉරියව් දකින විට ආතතියෙන් පෙළෙන ජනතාව මහා සංවේගයකින් පුදුමාකාර නිවීමකට පත්වෙනවා. ඔවුන්ගේ ජීවිතය සුඛිත මුදිත කර දීමට සැනසිලිදායක නිවීමකින් අභ්‍යන්තරික සාමයකින් සාමාදානයකින් ජීවත්වන්න භාග්‍යවතුන් වහන්සේගේ දේශනා ප්‍රායෝගිකව ඔවුන්ගේ ජීවිත තුළට ළඟාකර දීම භික්ෂූන් වහන්සේ අනුගමනය කළ යුතු කාර්යභාරයක් ලෙසයි මා දකින්නේ.

හේමමාලා රන්දුනු

# අසාධාරණයට වෛර කළත් විපාකය තමන්ට ම යි

**සමහර අවස්ථාවක කෙනෙක් අපේ යහපත වෙනුවෙන් දෙයක් කීවත් අපිට හිතෙන්නේ බැන්නා කියලා. ඒ දේ නැවත නැවත මෙනෙහි කරද්දී අපිට තේරෙන්නෙ නෑ හිතේ වෛරයක් පිහිටනවා කියලා. බද්ධ වෛරය කියන්නේ වෛරයට සිත බැඳෙනවා කියන එකයි.**

වෛරී සිත බැඳුනට පස්සේ සිතේ ස්වභාවය අඳුනා ගන්න බෑ. ඒ සිත හඳුනා නොගත්තොත් අපිට ජීවත් වීමට වෙන්නේ අකුසල් ගොඩක් සමඟ. එවිට කුසලයට කුසලයක් උපදවන්න බැරිවෙනවා.

සමහර දෙනා වෛර බඳිනවා පුංචි දේටත්. සමහර දෙනා වෛර බඳිනවා ලොකු ලොකු දේට. පුංචි වේවා, විශාල වේවා යමක් කෙරෙහි සිතේ ඇතිවන වෛරය නම් යහපත පිණිස පවතින්නේ නැහැ. භාග්‍යවතුන් වහන්සේ වෛරයට උපමාවක් වදාළා. ඒතමා ගසක සියලු සාරය උරා ගන්නේ ගසේ මුලයි. එහි කඳ, කොළ, පොතු, මුල්, ගෙඩි සියල්ලට ම ඒ සාරය අවශ්‍යයි. ඒ වගේ ම කෙනෙක් තුළ හට ගන්නා ක්‍රෝධය මුල් ඇදලා නම් ඔහුගෙ ක්‍රියාවේ වචනයේ සිතිවිලිවල තියෙන්නෙ ක්‍රෝධය පළිගැනීම නැමැති අකුසලයයි. කුසල් සිතක මාත්‍රයක්වත් ඔහු තුළ නැති බව ඒකාන්තයි.

බුදුරජාණන් වහන්සේ වැඩ සිටි කාලයේ සැවැත්නුවර එක් පුරුෂයෙක් ජීවත් වුණා. ඔහුගේ බිරිඳට දරුවන් නැති නිසා තවත් බිරිඳක් කැන්දාගෙන ආවා. ඇයට දරුවන් ලැබුණොත් දේපළ අයිති වේ යැයි ඉරිසියාවෙන් පළමු බිරිඳ දෙපාරක් ම දෙවැනි බිරිඳ ගේ කුස පිළිසිඳ ගත් දරුවන් ගබ්සා කර දැමීමට බෙහෙත් දුන්නා. තුන්වැනි දරුවාට බෙහෙත් දෙන විට දරුවා හොඳින් වැඩිලා හිටියේ. ඒ දරුවත් සමඟ ම ඒ මව මරණයට පත්වුණා. ඒ අහිංසක මව මහා වේදනාවක් විඳ මරණයට පත්වුණා. ඇගේ මොනයම්වත් වරදක්, තිබුණේ නෑ. නිරපරාදේ දරුවන් තුන් දෙනත් ඇයත් මරණයට පත්වුණා.

සැබෑවට ම ඇයටයි අසාධාරණය සිදුවූයේ. මේ සසරේ අපට කිසි විට සාධාරණය නම් වන්නේ නෑ. සසර පුරාවට අප අසාධාරණයට ලක් වෙමින් අනන්ත දුක් විඳිමින් යා යුතුව පවතිනවා.

ඉතින් ඇගේ සිතේ වෛරයක් හටගත්තා. මම මැරිලා යක්ෂණියක් ව ඉපදී නුඹේ දරුවන් සහ නුඹ මරනවා කියලා හිත පිහිටුවා ගත්තා . මරණයට පත්වූ ඇය ඒ නිවසේ ම බැළලියක ව උපන්නා. පළමු බිරිඳගේ ස්වාමියා ඇය කළ දේ දැනගෙන පහර දුන්නා. එයින් ආබාධයට පත්ව ඇය මියගොස් එම නිවසේ ම කිකිළියක් ව ඉපදුණා.

බැළලිය, කිකිළිය දමන දමන බිත්තර කා දමනවා. කිකිළියත් කා දමන්න මාන බලනවා. ඉතිං කිකිළිය හිතනවා "මා දමන දමන බිත්තර කා දමන නුඹවත් නුඹගේ දරුවනුත් මට කන්න ලැබේවා" කියලා කිකිළිය මියගොස් දිවිදෙනකට දාව උපන්නා. බැළලිය මියගොස් මුව දෙනකට දාව උපන්නා. මුව දෙන දරුවන් වදන විට දිවිදෙන ඇගේ පැටවුන් කා දමනවා. මුවදෙන වෛරය පිහිටුවා ගත්තා මගේ දරුවන් කා දමන මැයවත් මැයගේ දරුවනුත් මට කන්න ලැබේවා" යැයි ප්‍රාර්ථනා කළා.


මුවදෙන යක්ෂ කුලයේ උපන්නා. දිවිදෙන මියගොස් සැවැත් නුවර කුල දුවක ව උපන්නා. ඇයට උපන් දරුවන් දෙපාරක් ම යක්ෂණිය විසින් කා දැමුවා. මේ සිද්ධි දාමයේ පළමුවෙන් දරුවන් සමඟ මරණයට පත් වූ අහිංසක මවයි මෙසේ යක්ෂණියක් ව උපන්නේ. ඉරිසියාවෙන් මත්වී ඇයත් දරුවනුත් මරා දැමූ දුෂ්ට කාන්තාව මිනිස් ලෝකයේ ඉපදී සිටිනවා. තුන්වැනි දරුවත් කා දමන්නට යද්දි තමයි ඒ දරුවා රැගෙන මව ජේතවනාරාමයට දිව ගියේ. එදා බුදු සමිඳුන්ගේ වදන් ඇසූ යක්ෂණිය වෛරය අත්හැර සැනසීමට පත් වුණා. සතර අපායෙන් මිදී ගිය ඔවුන් දෙදෙනා ම වෛරය නිසා ඇවිලී ගිය චිත්ත සන්තාන දහම් සිසිලසෙන් නිවා ගත්තා. නමුත් මෙසේ වෛරය හැරදා සැනසිල්ලට පත්වන්නට හැම දෙනාට ම අවස්ථාව ලැබෙන්නේ නෑ.


එක්තරා සිටු පුත්‍රයන් හතර දෙනෙක් හිටියා. ඔවුන් සල්ලාල ජීවිතයක් ගත කළේ. දවසක් මේ හතර දෙනාම එකතුව මුදල් දී ගණිකාවක් එක් දිනකට වෙන් කර ගත්තා. එක්තරා උයනකට රැගෙන ගියා. කාමයෙන් මත්වී දවස පුරාම හැසිරුණා. මිනිසුන්ගෙන් තොර උයන දකිද්දී ඔවුන්ට මෙවැනි අදහසක් ඇති වුණා.
"ඇය ව මරා අප දුන් කහවණු සහ ඇගේ රන් පළඳනා පැහැර ගමු" කියා. හතර දෙනාම එයට එකඟ වුණා. කතිකා කරගත් දේ කාන්තාවට හොඳින් ඇසුණා. ඇයට තරහ සිතක් හටගත්තා. අසරණ ඇය කල්පනා කළා මොවුන් කිසි ලජ්ජාවක් නැති අය යි. දවස පුරාම මා සමඟ සිට දැන් මා මරා දමන්නට සූදානම් වන්නේ. මරණයට පත්වෙද්දි ඇය සිතුවා මම යක්ෂණියක් ව ඉපදී මොවුන්ව මරනවා කියා හිතේ වෛරය පිහිටුවා ගත්තා. මරණයට පත්ව යක්ෂණියක් ව උපන් ඇය සියක් වතාවක් ආත්මවල දී ගව දෙනකට ආවේශ වී ඔවුන්ගේ දිවි තොර කළා. ඇත්තෙන් ම අසාධාරණය සිදුවූයේ ඇයටම යි. සසර පුරා නැවත නැවත අසාධාරණයට බඳුන් වූයෙත් ඇගේ හිතේ පිහිටුවා ගත් වෛරයට යි. දුස්සීල වූ මිනිසුන් හතර දෙනාත් සසරේ දිගටම පැමිණියා. ඈ බද්ධ වෛරය හිත තුළ පිහිටුවා ගෙන එද්දී ඔවුන් වරදට විපාක විඳින අතරම කුසලයක සිත පිහිටුවා ගැනීමට වුණා. සාධාරණය , යුක්තිය ඉටුවිය යුත්තේ ඇයට යි. එනමුදු හොඳින් විමසා බලන්න ඇය පිහිටුවාගත් වෛරය අවසන් වූයේ කොතැනින් ද? කියා සිතා බලන්න.

ක්‍රෝධය නමැති විෂ මූලය සිතේ පිහිටුවා ගත්තාට පස්සේ ඇය සතුටු වූයේ පළි ගැනීමෙන් ඇය මරා දැමුවේ ඇය අතවරයට ලක් වූයේ ඇයගේ ආභරණ පැහැර ගත්තේ එක් වතාවක් පමණ යි. එහෙත් වෛරය විසින් ඔවුන් සියක් වාරයක් මරා දැමුවා. ඇගේ වෛරය සංසිඳුනේ නැහැ. වෛරය කිසිදින වෛරයෙන් සංසිඳෙන්නේ නෑ. තම සිතේ පිහිටුවා ගත් වෛරය විසින් මෙවර මරා දැමුවේ කවරෙක් ද? සියලු කෙලෙසුන් ගෙවා දමා සැනසිල්ලට පත් වූ පරම පිවිතුරු හද මඬලක් දරා වැඩසිටින බාහිය නම් උත්තම මහරහතන් වහන්සේ යි. සිත පිහිටුවාගත් වෛරය ඇයටත් නොදැනීම කල්පයක් පුරාම දුක් විඳවන ආනන්තරීය පාප කර්මයක් කරා ඇයව ගෙන ගියා

වෛරය කියන දේ මොන ආකාරයකින් විමසා බැලූව ද එය විෂම යි. මේ සසරේ නිතර ම පවතින්නේ අසාධාරණය පමණ යි. ඒ නිසා ත්‍රිවිධ රත්නය කෙරෙහි සිත පහදවා ගෙන නිසැක බවට පත් වෙන තුරුම වරදට සමාව ගැනීම කළ යුතුයි. වෛරය සිතේ පිහිටුවා ගෙන නො සිට වරදට සමාව දීම කළ යුතුයි. යමෙක් තව කෙනෙක් ගැන වෛරය පිහිටුවා ගනී නම් පළමුව අ සාධාරණය වන්නේ තමාට ම යි. ඔහු අන් අය නැසීමට පෙර
තමා වම නසා ගන්නවා

නයනා නිල්මිණී





# ස්වාක්ඛාත සදහම් ගුණය

"අභිඤ්ඤායාහං භික්ඛවේ ධම්මං දෙසෙමි නො අනභිඤ්ඤය සනිදානාහං භික්ඛවේ ධම්මං දෙසෙමි නො අනිදානං සප්පටිහරියානං භික්ඛවේ ධම්මං දෙසෙමි තො අප්පටිහාරියං තස්ස මය්හං භික්ඛවේ අභිඤ්ඤය ධම්මං දෙසයතො නො අනභිඤ්ඤය සනිදානං ධම්මං දෙසයතො නො අනිදානං සප්පටිහරියං ධම්මං දෙසයතො නො අප්පටිහාරියං කරණීයෝ ඕවාදො කරණීයා , අනුසාසනී, අලංච පන වො තුට්ඨියා අලං අත්තමනනාය අලං සොමනස්සාය සම්මා සම්බුද්ධෝ වත භගවා ස්වාක්ඛාතෝ ධම්මො සුපටිපන්නො සංඝොති.

(අංගුත්තර නිකායේ තිකනිපාතය)

" මහණෙනි, මම ධර්මයන් ප්‍රත්‍යක්ෂ වශයෙන් ම දැන දේශනා කරමි. නොදැන දේශනය නොකරමි. හේතු සහිතව දේශනය කරමි. හේතු රහිතව නොදෙසවයි. විරුද්ධවාදීන් බැහැර කිරීම් වශයෙන් ප්‍රතාහාර්ය සහිතවම ධර්මය දේශනා කරමි. ප්‍රාතිහාර්ය රහිතව නො දෙසවමි. මහණෙනි , එසේම ධර්මය දේශනා කරන්නා වු මාගේ අවවාදය අනුශාසනය කළ යුතු ය. මහණෙනි භාග්‍යවන්තුන් වහන්සේ ඒකාන්තයෙන් ම සම්‍යක් සම්බුද්ධයහ. ධර්මය ස්වාක්ඛාතය, සංඝයා සුප්‍රතිපන්නයයි. සතුටු වීමට සුදුසු ය"

යනු එහි අර්ථයයි. සසර සැරිසරන සත්වයා අන්ධකාරයෙන් මෝහණය වී සත්‍ය අසත්‍යය වටහාගත නොහැකිව උන්මත්තකයන් මෙන් කටයුතු කරන කාලයක දී ලොව්තුරා දහම දේශනා කළ සේක. අවබෝධ කරගත යුතු සියලු දහම මනාව අවබෝධය කරගත් උන්වහන්සේ දහම් පිපාසයෙන් සිටි, සත්වයාට මනාව දේශනා කරමින් ලෝවැසි සත්වයා යහමගට ගත්හ.

උදාරතරම ගුණයෙන් පෝෂණය වූ මෙම දහම ලෝකයාට දේශනා කිරීමට පටන්ගත් විට "අන්ධයන්ට ඇස් පෙනීම ද, ගොලුවන්ට කථා කිරීමට ද, බිහිරන්ට කන් ඇසීමත් සිදුවූයේ" අශ්චාර්යමත් ලෙසිනි. සිදුහත් ගෞතම බුදුන්වහන්සේ ගේ ශ්‍රී මුඛයෙන් දේශනා කළ හැම වචනයක් තුළින්ම දහස් සංඛ්‍යාත සත්වයන් සුමගට යොමු වූහ.

තථාගතයන් වහනසේ දේශනා කළ එම සාරධර්මයේ ඇති ප්‍රධානතම ගුණ 06 න් වටිනාම ගුණයන් ලෙස ස්වාක්ඛාත ගණය හැඳින්වීමට පුළුවනි. බුදුන් වහන්සේ දේශනා කළ මෙම දහම පරම සත්‍යයක් වන බැවින් ද, මුල, මැද, අග යන තුන්තැනින් කොතැනකවත් පිරිවිය යුතු අඩුවක් නැති බැවින් ද, සකස් කළ යුතු තැනැක් නැති බැවින් ද, නිශ්චලය වැඩිය කියා බැහැර කළ යුත්තක් නැති බැවින් ද ඒ ධර්මයන් අපාය දුඛ්‍යයන්, සංසාර දුක්ඛ්‍යයන්, මිදී සගමොක් සැප ලැබීමේ නොවරදින ප්‍රතිපදාවක් දක්වන ලද බැවින් ද, ඒ ධර්මය අනුව පිළිපදින්නවුන් ට ඒ පිළිපැදීමෙන් ලෞකික ලෝකෝතර සකල සම්පත්තීන් ම ලැබිය හැකි බැවින් ද ඒ ධර්මය "ස්වාක්ඛාත ධර්මයක්" වන බව විසුද්ධිමාර්ගයේ දක්වා ඇත.

ලෝකයේ පහළ වූ නොයෙක් ශාස්තෘවරුන් විවිධ දහම් ඉදිරිපත් කර ඇත. එනමුත් එම දහම තුළ නිසි හරයක් ලබන්නට ශ්‍රාවකයාට හැකියාව නැත. එම ශාස්තෘන් ඉදිරිපත් කළ දර්ශනයන් තුළින් ශ්‍රාවකයාට නියම විමුක්තිය ලබා ගැනීමට නොහැකි ය. ශ්‍රාවකයන් එම දහම තුළ ඇතැම්විට මුළාවට පත්වේ. මනස වික්ෂිප්ත වේ. යා යුතු මාවත නොපෙනෙයි.

නමුත් සිදුහත් ගෞතම බුදුරජාණන් වහන්සේ ලෝකයට දේශනා කළ දර්ශනය තුළ සත්වයා අන්ධකාරයේ සිට ආලෝකය කරා පැමිණෙන්නා සේ, යථාර්ථවාදී සුවයක් වින්දනය කළ සේක. එම අමාමහ නිවන් සුවය ලැබීමට හැකියාව ඇත්තේ බෞද්ධ දර්ශනය තුළින් පමණි.

"ධම්මං විනා නත්ථි පිතාච මාතා
නමෙව තාණං සරණං පතිට්ඨා
තස්මා හි භො කිච්චමඤ්ඤප්පනාය
සුනාථ ධාරෙථ චරාථ ධම්මෙ"

රසවාහිනිය නැමති ග්‍රන්ථය තුළ සඳහන් ඉහත ගාථාව තුළින් පැහැදිලි වන්නේ "ධර්මය හැර සත්ත්වයනට මවක් , පියෙක් නැත. ඒ ධර්මය ම සත්ත්වයනට ආරක්ෂාව ය, සරණ ය, ප්‍රතිෂ්ඨාව යයි, පින්වතුනි, එබැවින් අන් සියලු වැඩ නවත්වා ඒ දහම අසව් ධර්මයෙහි හැසිරෙව්. යනුවෙන් සඳහන් වේ.

මෙම නිර්මල වු ස්වාක්ඛාත ගුණයන්ගෙන් පෝෂණය වු දහම තුළ ජීවත්වන පුද්ගලයාට විමුක්තිය උදාවෙයි. කල්ප සිය දහස් ගණනකින් ලැබිය හැකි දුර්වල වු මිනිසත් බවක් ලබා, කල්ප සිය දහස් ගණනක් ගත වුවත් ඇතැම් විට කනට අසන්නට හැකියාව නොලැබෙන මේ නිර්මල දහම යම් තැනක දී අසන්න ලැබෙනවා නම්, මනාව ඇසිය යුතු ය. බුදුරජාණන් වහන්සේ සසර සැරිසරා පාරමී දම් පරිපූර්ණත්වයට පත්කරමින් අවබෝධ කර ගත් මේ ශ්‍රේෂ්ඨ වු නිර්මල සද්ධර්මය තිරිසන් බව මුදවා සත්වයාට සැනසුම උදාකරයි. කිසිදු තැනකට ශ්‍රාවකයාට ප්‍රශ්නයක් ගැටලුවක් මතු නොවන ආකාරයට හැම තැනම සම්පූර්ණ ව යථාර්ථවාදි ව දේශනා කර ඇති ස්වාක්ඛාත ආදි ගුණයන්ගෙන් හෙබි මෙම දහම අනුව ජීවත් වෙමු.

සිතුල්පව්ව රාජමහා විහාරවාසි
යෝධකණ්ඩිය ශ්‍රී දේවානන්ද
මහා විද්‍යාලයේ ආචාර්ය
ශාස්ත්‍රවේදී
**බෝපාගොඩ නාගිත හිමි**

# පරාජයට මුල පමාවයි

**සැවැත් නුවර වැසි මිතුරන් දෙදෙනෙක් වූහ. තෙරුවන් පිළිබඳ සැදැහැවත් වූ මේ දෙදෙනා පැවිදි බවට පත් වූහ. පැවිදිවීමෙන් පසුව ද උන්වහන්සේ දෙනම ඉතා මිත්‍රශීලීව වාසය කරති. මේ භික්ෂූන් වහන්සේ දෙනම බුදුරජාණන් වහන්සේ වෙතින් කෙලෙස නසා රහත්වීමට සුදුසු භාවනා පිළිවෙත් ඉගෙන ගත්හ. වස් කාලයෙහි විදසුන් වඩමින් වාසය කිරීම සඳහා දුෂ්කර කැලෑබද පළාතක වෙහෙරකට වැඩියහ.**

මෙම භික්ෂූන් වහන්සේ දෙනමගෙන් එක් නමක් කල් ඇතිව ගිනි මෙළවීමට සුදුසු වියළි දැව දඬු, පරඬලා රැස් කැරැගෙන ගිනි මොළවා ගිනි තපී. ඒ වගේම එම විහාරයෙහි වැඩ සිටින කුඩා තෙරුන් වහන්සේ සමඟ නිසරු දෑ දොඩමින් කල් ගෙවයි. මේ ආකාරයෙන් පෙරයම, දස පැය ගිනි තැපීමෙන් හා නිසරු දොඩමලුවීමෙන් කාලය ගත කරයි. අනික් කාලය නින්දෙන්ම ගත කරයි. මේ ආකාරයෙන් කාලය ගෙවන උන්වහන්සේට, දුෂ්කරව වන මැද විසීමට පැමිණි කාරණය පිළිබඳ මඳකුදු සිහියක් නොවීය. පමාවෙන් හා කුසීත බවින් දවස ගෙවා දමයි.

වස් කාලයෙහි විදසුන් වැඩීමට නිස්කලංක දුෂ්කර කැළෑ බද වෙහෙරට වැඩිය අනෙක් භික්ෂූන් වහන්සේ තමන් වහන්සේගේ අදහස මුදුන් පමුණුවා ගැනීම සඳහා සිහි නුවණින් යුතුව මහණ දම් රකිති. නිදිවරා වෙහෙසවී පිළිවෙත් පුරා, විදසුන් වඩා කෙලෙස් මුල් සිඳ දමා රහත්ඵල පැමිණ විමුක්ති සුව අත්පත් කර ගත්හ.

රහත්ඵල ලැබූ සංඝයා වහන්සේ තමන් වහන්සේ සමඟ පැමිණි මිතුරු භික්ෂූන් වහන්සේගේ පමා බව, මුළාවෙන් විසීම දැක බොහෝ කනගාටුවෙන් අවවාද කළහ.

"මහණදම් පිරිමෙහි පමා වූ තැනැත්තාට සිවු අපාය සිය නිවෙස මෙනැයි පැවැසීය. කෙසේ අවවාද දුන්නද පමා ගති ඇති භික්ෂූන් වහන්සේ ඒ කිසිවක් නො සලකා අලසකම නිසා ම පිරිහුණෝ ය. කෙසේ වුව ද මේ සංඝයා වහන්සේ දෙනම අතර කිසි දවසක මොහොතකු ද සමගිය නම් නොබිඳුණි.

වස් කාලය අවසානයේ දෙනම වහන්සේ සමඟිව, සතුටුව බුදුරජාණන් වහන්සේ වැඩ සිටි දෙව්රම් වෙහෙරට පෙරළා වැඩියහ.

**"අප්පමත්තෝ පමත්තේ සු
සුත්තේ සු බහු ජාගරො
අබලස්සං ච සීඝස්සො
හිත්වා යාති සුමෙධයො**

නො පමා වූ, බොහෝ නිදිවැරැම් ඇති, උතුම් නුවණැත්තා වහා නිවන් පසක් කරන්නේ ය.

බුදුරජාණන් වහන්සේ මේ දෙනම වහන්සේ සමඟ පිළිසඳර කතා කළ සේක. සුවදුක් විමසූහ. රහත් බවට නො පැමිණි භික්ෂූන් වහන්සේ වැරැහීන වූවකු සේ පමාවෙන් වසා අමා මඟ නොලත් බවත්, රහත් වූ තෙරනම නොපමා ගුණයෙන් රැඳී වැරැවැඩුම නිසා භාවනාවේ සිත මොනවට ඇලී විමුත් සුව ලත් බවත් වදාළ සේක.

පමා වූ පුද්ගලයා, අලසකමින් කල් යැවූ තැනැත්තා, කොර වූ පා ඇතිව, දුබල ව, ජවය සිඳී ගිය අසකු මෙන් නියම ඵල නොලබා, පරාජය ලබන්නේ ය. පමා නොවූ වැරැසර යුතු නැණවත් තැනැත්තා වහා දිවෙන බලැති අසකු සේ වහා මඟපල ලබා සෙස්සෝ පසුකොට නිවන් පසක් කරන" බව ද පැහැදිලි කොට වදාළ සේක.

පෘථග්ජන අපගේ ජීවිතයට මෙය මහඟු ආදර්ශයකි. අලසව, අන් අය සමඟ නිසරු දෑ දොඩමින් කාලය ගෙවා දැමීම තම මුළු ජීවිතය ම පිරිහීමට ලක් කර ගැනීමකි. ඉගෙනීම ද, රැකියාව ද හෝ වෙනයම් කර්මාන්තයක් වේවා තම අදහස මුදුන් පමුණුවා ගැන්ම සඳහා ම සිහිනුවණින් කටයුතු කළ යුතු ය. ඒ වෙනුවෙන් ම කැපවිය යුතු ය. එවිට අපගේ ජීවිතය සාර්ථකව ඉදිරියට රැගෙන යා හැකි වේවි. එම සාර්ථකත්වය බාහිර වශයෙන් පමණක් නොවිය යුතු ය. ආධ්‍යාත්මික දියුණුවක් ද විය යුතුයි. නිරතුරුවම අප ආගම දහමට අනුව ද ජීවිතය පවත්වා ගත යුතු ය. එවිට සාර්ථකත්වයේ නියම ඵල අපට නෙළා ගත හැකිවේවි. බාහිරවත්, ආධ්‍යාත්මිකවත් ලබන දියුණුවයි ජීවිතයේ ජයග්‍රහණය විය යුත්තේ.

දීපා පෙරේරා



දුටුගැමුණු මහ රජතුමා 74 කොටස

# යුද ජයග්‍රහණයට දීඝාභයගේ සහය අවශ්‍යයි

භික්ෂූන් වහන්සේ සතු බලය ලෝකයට ප්‍රකාශ කරන මහාසිව මාහිමිපාණන් වහන්සේත්, ත්‍රිපිටකතිස්ස තෙරුන් වහන්සේත් ගැමුණු කුමරු හදා වඩා ආරක්ෂා කර ගත් ආකාරය සිරිනාගට සිහිපත් විය. එමෙන්ම මිත්‍ර මහ සෙනෙවිගේ පාපකාරී සිතිවිලිවලට නතු වීම නිසා තමාගෙන් සිදුවන්නට ගිය විපත සිතට නැඟී මහත් පසුතැවීමක් ඇතිවිය.

තමා විසින් මිත්‍ර මහ සෙනෙවිට කෙටූ කඩුව තවමත් අධිකරණයේ ය. ඝාතකයා තවමත් සොයාගත නොහැකි වී ඇත. සුමන මහ සිටුතුමාගේ අවතාරයට එය පවරමින් අමතක වන්නට හැරීම කාගේත් මානසික සුවයට හේතු වූ බව ඔහු කල්පනා කළේ ය.

බෝධිනාගට පියා යැයි කියන්නට ලැබීම සිරිනාගට ආඩම්බරයකි. ඔහු උතුම් මිනිසෙකි. සැබෑ සිංහලයෙකි. විමලීගේ මරණයෙන් පසුව ඊට වගකිව යුත්තන්ගෙන් ඔහු පළිගන්නට ගියේ නැත. ඔහු එසේ කළේ මරණාසන්නව සිටියදී ඇය කළ ඉල්ලීමට ගරු කිරීමක් වශයෙනි. සිය ආදරණීය බිරිඳට ගරු කළ හැකි එකම මඟ එය විය.

බෝධිනාග සත්‍ය දැන නොගත්තා නම් තමාත්, මෑණියන් මෙන්ම අත්තන ඇටවලින් මිය යන්නට තිබුණායි ඔහු වේදනාවෙන් අතීතය සිහිපත් කළේ ය.

“පුතා බර කල්පනාවක. ඇයි රාජකාරී කටයුතු බහුල ද? සමන්තී මාතාව පැමිණියේ සිරිනාග තේ මේසයට කැඳවන්නට ය.

“නැහැ මෑණියනි, ජීවිතයේ බැරෑරුම්කම ගැනයි කල්පනා කළේ. දැන් යුද්ධය අත ළඟ. ජය පරාජය ගැන සිතන්නට බැහැ. මට මුලින්ම මෑණියන් රැක ගන්නට ඕනෑ. ඒ වගේම ජයනාථ සිටුතුමා, සිටුදේවිය සිටු දියණිය අමිතාටත් ආරක්ෂාව ලබා දෙන්නට ඕනෑ.

“මෑණියනි, අමිතා වචනයෙන් ප්‍රකාශ නොකළත් මට ආදරය කරන බව හැඟෙනවා. මමත් ඇයට කැමතියි.” විලිබරව සිනාසුනු සිරිනාග කීවේ ය.

“මහ සිටුතුමාත්, සිටු දේවියත් මට මව්පියන් වගෙයි.”

“අද රාත්‍රී භෝජන සංග්‍රහයට සිටුතුමා අප එහි කැඳවා තිබෙනවා. පුතා කීවත් නැතත් අපි හිතාගෙන ඉන්නේ අමිතා ගැන සිටුතුමාත්, සිටු දේවියත් සමඟ කතා බහ කරන්නයි.”

“මෑණියනි, මා ඉදිරිපිට දී නොවෙයි. මා නැති තැනක දී කතා කරන්න.”

සිරිනාග බියටපත් වූවකු මෙන් කීවේ ය. සමන්තී මාතාව සිනා නැඟුවා ය.”

“පුතා, ඔබගෙන් මම ප්‍රශ්නයක් අසනවා. එයට අවංකවම උත්තරයක් දෙනවා ද?”

“ඇයි මෑණියනි, මා ගැන සැකයක් තිබෙනවා ද?.

“සැකයක් නැහැ පුතා. මගේ සැනසීම සඳහා දැනගත යුතු කරුණක්.”

“මෑණියන් අසන්නට යන්නේ පුණ්ණා ගැන ද?”

“නැහැ. ඒ ගැන මගේ සැකයක් නැහැ. මිත්‍රගේ අදහස ඉටුවුණාවේ. උපතිස්ස - පුණ්ණා දෙදෙනා කැමති දිනක විවාහය සිදු කරනවා.

“එසේනම් මෑණියනි, කුමක්ද? කාරණය”

“පුතා මෙයයි මට දැනගන්නට වුවමනා. දුටුගැමුණු රජතුමා මහවැලි ගඟින් මෙගොඩව අනුරාධපුරයට පහර දෙන්නට පටන් ගත් විට පුතා ඇත්තටම ගන්නේ කාගේ පිල ද?” දිය යුතු පිළිතුර කුමක්ද? ඔහු කල්පනා කළේ ය.

“මෑණියනි, මට සමාවෙන්න. මිත්‍ර මහ සෙනෙවි මෙන් මට දැන දැන වැරැදි කරන්නට බැහැ. පටු වාසි තකා මට ජාතිද්‍රෝහී වන්නට බැහැ. මගේ හෘද සාක්ෂියට අනුව මම සේවය කරන්නේ දුටුගැමුණු රජතුමාට.”

සමන්තී මාතාව සැනසුම් සුසුමක් හෙලුවා ය. මඳ සිනා පෑවා ය.

“පුතා හරි, මගේ හිතේ නිතරම තිබුණේ පුතාට ගත යුතු නිවැරැදි මඟ කියන්නයි. නමුත් පුතාගේ නිලතලවලට, සැප සම්පත්වලට හානි කරන්නට මට සිතුණේ නැහැ.”

“මෑණියනි, මට නිවැරැදි මඟ පෙන්වා දුන්නේ මගේ පියා. ඔබේ සහෝදරයා බෝධිනාග. කුඩා කාලයේ දී ඔහු මට වෛර කළා. නමුත් මා නිවැරැදි මාර්ගයේ ගමන් කරන විට ඔහු මට ආදරයෙන් සැලකුවා.

මා ගමන් ගත් වැරැදි මාර්ගයෙන් මුදා ගත්තේ මහාසිව මාහිමිපාණන් වහන්සේ යි.”

“පුතා සිරිනාග. මේ රට අපේ. එළාර ආක්‍රමණිකයෙක්. හැකි තරම් කාලයක් මේ රට සුරා කෑම ඔහු ඇතුළු පිරිසගේ අදහසයි. බොරුවෙන්, වංචාවෙන් ඔවුන් කරන ජාතික ආගමික විනාශය නතර කරන්නට ඕනෑ. පරසතුරන්ට මේ රට යටත් කර ගන්නට දිය යුතු නැහැ.”

“මෑණියනි මා දැනටමත් සේවය කරන්නේ දුටුගැමුණු මහ රජතුමාට යි. මගේ පරවි දූතයා ඉටුකරන්නේත් ඒ සේවයේ කොටසක් තමා.”

සමන්තී මෑණියන්ගේ සිතට අප්‍රමාණ සතුටක් දැනිණි. සිරිනාගගේ හිස අතගා තම සතුට පළ කළා ය. ඇගේ සතුට සිරිනාගට ද සතුටක් විය.

විවෘතව තිබුණු කවුළුවෙන් පියාඹා ආ පරෙවියා සිරිනාගගේ උරහිස මත ලැග්ගේ ය. සිරිනාග ඌ අතට ගෙන පියාපත් පිරිමැද කකුළක බැඳ තිබුණු තල්පත ලිහා ගත්තේ ය.

“පරෙවියෝ උඹ කැමති පලතුරුවලටද? වී පොරි වලට ද? වැලිතලප වලට ද?”

ඔහු රිදී තැටියක් රැගෙන ඒ මත වැලිතලප කැබැල්ලක් හා පලතුරු කිහිපයක් තබා පරෙවියාට ළං කළේ ය. වී පොරි ටිකක් සාදාගෙන එන ලෙස සේවිකාවකට කීවේ ය.

“පරෙවියෝ උඹ ආපසු යන්නේ හෙට. අද කැමති විදිහකට විවේක ගනින්. හැබැයි ඇවිදින්නට යනවා නම් පරෙස්සමින්.”


සමන්තී ද පරෙවියා දෙස බලා සිටියේ ආදරයෙනි. සිරිනාග දවටනය ලිහා තල්පත් දෙකක් අතට ගත්තේ ය. සමන්තී මෑණියන්ට ද ඇයෙන ලෙස එය කියවීය.

විහාර මහා දේවියත්, දුටුගැමුණු රජතුමාත් සියලු හමුදා බල සේනා සමඟ ළඟදීම මහියංගණයට පැමිණ කඳවුරු බඳීවි. මහියංගණය බලකොටුව ජයගෙන එහි වෙහෙර විහාර ප්‍රතිසංස්කරණයට මාස කිහිපයක් ගනීවි. ඊට පසු දකුණු ඉවුරේ බලකොටු බිඳිමින් කසාතොට දක්වා යාවි. එතැනින් මහවැලිය තරණය කර එන්නේ විජිතපුරයට.”

“මාත් ත්‍රිපිටකතිස්ස හිමියනුත් දින කිහිපයක් මහියංගණ මහ විහාරයේ  නතර වෙනවා. හදිසි දෙයක් සිදුවුණොත් පරෙවියා මෙහි එවන්න, ඌ මෙතැන දන්නවා.”

“කසාතොටින් ගඟ තරණය කළ පසු සිංහල සෙබලුන්, සිංහල පුරවැසියන් අපට පක්ෂපාතී කර ගැනීමේ කටයුතුවල භික්ෂූන් වහන්සේ නිරත වේවි. දීඝාභය උපතිස්ස දෙදෙනා වෙනස් කර ගැනීමට උපාය යොදන්න. ඒ සඳහා කුණ්ඩල බ්‍රාහ්මණතුමාගේ උපකාර ලබා ගත්හ.”

පුතා දීඝාභයගේ සිත වෙනස් කළ හැක්කේ දන්තී කුමරියට පමණයි. උපතිස්ස වෙනස් වෙන්නේ දීඝාභය අනුව. දැන් මේ දෙදෙනාම තමන් ඉන්නේ වැරදි පිරිසක් සමඟ බව තේරුම් අරගෙන. ඒත් දීඝාභයගේ සිත තුළ දුටුගැමුණු රජතුමා කෙරෙහි දැඩි වෛරයක් පවතිනවා. ඒකට හේතුව මාගම රාජ්‍ය පිළිබඳ අවුලක් බවයි පුණ්ණා පැවසුවේ.



අයන්ති විතාන